# 04 ව්‍යාපාර සංවිධාන

## සංවිධානය

පොදු අරමුණක් ඉටුකර ගැනීම සඳහා ඒකරාශි වී සිටින පුද්ගල කණ්ඩායමකින් සැදුම්ලත් සමාජ ඒකකයක් සංවිධානයක් ලෙස හැඳින්වේ .

උදාහරණ:-

පාසල, පන්සල, පල්ලිය ,වෙළඳසැල, ක්‍රීඩා සංගම්...

සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ ,

01.අරමුණක් තිබීම.

02. පුද්ගලයින් සිටීම.

03. සංවිධාන ව්‍යුහයක් පැවතීම.

## ව්‍යාපාර සංවිධාන ,

ලාභ ඉපයීම හෝ සමාජ සුභසාධනය අරමුණු කරගෙන මිනිස් අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා භාණ්ඩ හෝ සේවා නිපදවීම,බෙදා හැරීම හා අලෙවිය සිදු කිරීමේ නිරත ව්‍යවසායන් "ව්‍යාපාර සංවිධාන "නම් වේ.

ව්‍යාපාර සංවිධානයක දැකිය හැකි පොදු ලක්ෂණ

01.අරමුණක් තිබීම.

02. සංවිධාන ව්‍යුහයක් තිබීම.

03. පුද්ගලයින් සිටීම.

04. ආර්ථික කටයුත්තක නියැලීම.

05.කළමනාකරණය හා පාලන ක්‍රමයක් පැවතීම.

06. පැවැත්මක් තිබීම.

07.ව්‍යාපාර කටයුතු වාර්තා කිරීමේ කිරීමෙ ක්‍රමයක් පැවතීම.

## ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය

ශ්‍රී ලංකාව තුළ දැනට ප්‍රචලිතව පවත්නා ව්‍යාපාර සංවිධාන ප්‍රධාන පදනම් දෙකක් යටතේ වර්ග කළ හැකිය.

01. හිමිකාරිත්වය මත / අයිතිය මත

02. අරමුණු මත.

හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන වර්ග වර්ගීකරණය.

හිමිකාරිත්වය මත ව්‍යාපාර සංවිධාන ප්‍රධාන කොටස් දෙකකට වර්ග කරයි.

රාජ්‍ය/ පොදු අංශයේ ව්‍යාපාර සංවිධාන .

පෞද්ගලික අංශයේ ව්‍යාපාර සංවිධාන.

ව්‍යාපාර සංවිධාන වල දැකිය හැකි නෛතික ලක්ෂණ

ව්‍යාපාර සංවිධාන එකිනෙකින් වෙනස් වන ප්‍රධාන ලක්ෂණ කිහිපයක් හඳුනාගත හැක .

වගකීම

ව්‍යාපාරයේ බාහිර වගකීම් සම්බන්ධයෙන් එහි හිමිකරුවන් වෙත ඇති බැඳියාව වගකීමයි. වගකීම කොටස් දෙකකි.

1. අසීමිත වගකීම්

ව්‍යාපාරයේ ණය හා වෙනත් බැඳීම් පියවීම සඳහා අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ පෞද්ගලික වත්කම් පවා කැප කිරීමට සිදු වීම අසීමිත වගකීමයි. එනම් අයිතිකරු හෝ අයිතිකරුවන් යොදන ලද ප්‍රාග්ධනයට වගකීම සීමා නොවීමයි.

උ.දා:- තනි පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර

2. සීමිත වගකීම්

අයිතිකරුවන්ගේ වගකීම තම ආයෝජනයට පමණක් සීමා වීමයි.එනම් අයිතිකරුවන්ගේ මූල්‍යමය බැඳීම ඔවුන් ව්‍යාපාරයට ආයෝජනය කළ මුදලින් ඔබ්බට පැතිරී නොයෑමයි.

උ.දා:- සංස්ථාපිත සමාගම්,සමුපාකාර

02. නීතිමය පුද්ගලභාවය

ව්‍යාපාරයකට සිය නමින් කටයුතු කිරීමට ඇති හැකියාවයි. ව්‍යාපාරය එහි අයිතිකරුවන් ගෙන් වෙන්වූ පුද්ගලයකු බව නීතිය ඉදිරියේ පිළිගන්නා බවයි.මේ නිසා පහත දෑ ව්‍යාපාරයකට සිදු කළ හැකිය.

1. ව්‍යාපාරය නමින් නඩු පැනවීමට.
2. ව්‍යාපාරය නමින් වත්කම් අත්පත් අත්පත් කර ගැනීමට.
3. ව්‍යාපාරය නමින් ගිවිසුම්වලට එළඹීමට.

උදා:සංස්ථාපිත සමාගම්, සමුපාකාර, රාජ්‍ය සංස්ථා.

අඛණ්ඩ පැවැත්ම

හිමිකරුවන්ගේ මරණය හෝ ඉවත්වීම, බුන්වත් වීම සිදු වුවද ඉන් බාධාවක් නොවී ව්‍යාපාරය පැවැත්ම අඛණ්ඩ වීමයි . කේවල ස්වාමි ව්‍යාපාර,හවුල්ව්‍යාපාර අඛණ්ඩ පැවැත්මක් නොමැති ව්‍යාපාර සංවිධාන වන අතර සංස්ථාපිත සමාගම්, සමුපාකාර අඛණ්ඩ පැවැත්මක් ඇති ව්‍යාපාර සංවිධාන වේ .

ලියාපදිංචිය

කිසියම් නාමයක් යටතේ ව්‍යාපාරයක් ආරම්භ කළ බවට අදාළ අදාල නීතිය යටතේ නියමිත ආයතනයකින් බලපත්‍රයක් ලබාගැනීම ලබා ගැනීම ලියාපදිංචිය ලෙස හැඳින්වේ. ව්‍යාපාරයක් ආරම්භ කළ බවට කිසියම් ආයතනයකින් ලැබෙන සහතිකයයි.

උදා :-කේවල ස්වාමි ව්‍යාපාර,හවුල් ව්‍යාපාර ලියාපදිංචි අනිවාර්යය නොවේ

සංස්ථාපිත සමාගම් ලියාපදිංචි අනිවාර්ය වේ.

සංස්ථාපනය / සංස්ථාගත කිරීම

ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම තුළින් එම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ලැබේනම් එය "සංස්ථාපනය" ලෙස හඳුන්වයි.

**ව්‍යාපාර සංවිධාන ක්‍රමයක් තෝරා ගැනීමේදී සලකා බලන සාධක .**

01. ව්‍යාපාරයේ ස්වභාවය

02. ප්‍රාග්ධනය සපයා ගන්නා ආකාරය

03. නීතිමය අවශ්‍යතා

04.හිමිකාරීත්වය

05. ව්‍යාපාරයේ පැවැත්ම

06. වගකීම/ අවදානම් ස්වභාවය

07. ලාභ ,පාඩු බෙදා ගන්නා ආකාරය

08. ආරම්භ කිරීම හා විසුරුවා හැරීම

**කේවල ස්වාමි ව්‍යාපාර**

හිමිකාරීත්වය තනි පුද්ගලයකු සතු වන අතර ඔහු විසින් ප්‍රාග්ධනය යොදා ලාභ ලැබීමේ අරමුණින් පවත්වාගෙන යන ව්‍යාපාර කේවල ස්වාමි ව්‍යාපාර නම් වේ.

උ.දා:- ෆෝඩ් මර්ට්

ජය ශ්‍රී ෂෝක් ෂොප්

විශ්ව මොටොර්ස්

ශශිනි ටයර් සර්විස්

කේවල ස්වාමි ව්‍යාපාර වල සුවිශේෂී ලක්ෂණ

01.අයිතිකරු විසින් තනිව ප්‍රාග්ධනය සපයා ගැනීම.

02.කළමනාකරණ තීරණ ගනු ලබනුයේ අයිතිකරු විසින් ම ය.

03.අයිතිකරුගේ වගකීම අසීමිත වීම.

04.ව්‍යාපාරය නෛතික පුද්ගල භාවයක් නොමැති වීම.

05.පදිංචි අනිවාර්ය නොවීම.

06.ලාභ හෝ අලාභ තනිව භුක්ති විදීම.

07.අවදානමට තනිව මුහුණ දීම.

08.අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

09.ගිණුම් තැබීම අනිවාර්යය නොවීම.

10.ව්‍යාපාරය නමින් බදු ගෙවීම් සිදු නොවීම.

කේවල ස්වාමි ව්‍යාපාර වල වාසි

01.පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.

02.සියලු ලාභ අයිතිකරු සතු වීම.

03.ස්වාධීන තීරණ ගත හැකි වීම.

04.බලපාන නීති රීති හා රෙගුලාසි අවම වීම.

05.ව්‍යාපාරික තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා වීම.

06.ගනුදෙනුකරුවන් සමග ඍජු සම්බන්ධතා පැවැත්වීමට හැකි වීම.

07.පාලන කටයුතු පහසු වීම.

08.ව්‍යාපාරය පහසුවෙන් අවසන් කිරීමට හැකිවීම.

කේවල ස්වාමි ව්‍යාපාර වල අවාසි

01.අයිතිකරුගේ වගකීම අසීමිත වීම.

02.ප්‍රාග්ධනය සපයා ගැනීමේ දුෂ්කරතා මතු වීම.

03.අයිතිකරු විසින් ම තීරණ ගනු ලබන නිසා ඒවා අසාර්ථක විය හැකි වීම.

04.නෛතික පුද්ගලභාවයක් නොමැති වීම .

05.අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම .

06.අලාභ තනිව භුක්ති විඳීමට සිදුවීම .

07.අයිතිකරුගේ කළමනාකරණ හැකියාව සීමිත වීම .

09.ව්‍යාපාරය පුළුල් වන විට කළමනාකරණ කටයුතු අපහසු වීම.

**කේවල ස්වාමි ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීම**

කේවල ස්වාමි ව්‍යාපාරයක් එහි අයිතිකරුගේ සම්පූර්ණ නමින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යනු ලබන්නේ නම් 1918 අංක 6 දරන දරණ ව්‍යාපාර නාම ආඥා පනත යටතේ ව්‍යාපාරය අයත් පළාත් සභාවේ ව්‍යාපාර නාම ප්‍රඥප්තිය අනුව පළාත් රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි කළ

යුතුය.ප්‍රායෝගිකව මෙම ලියාපදිංචිය අදාළ අදාල ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් සිදුකරගත හැකිය.

ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය

01. ව්‍යාපාරය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් කේවල ස්වාමි ව්‍යාපාර ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය ලබා ගැනීම.

02.අදාළ බල ප්‍රදේශයේ( ග්‍රාම නිලධාරී වසම) ග්‍රාම නිලධාරීගෙන් ව්‍යාපාර නාම ලියාපදිංචිය සඳහා හෝ වාර්තාව ලබා ගැනීම

03.ග්‍රාම නිලධාරි සහතික කළ වාර්තාව සහ සම්පූර්ණ කරන ලද ආකෘති පත්‍රය ලියාපදිංචියට අදාල ගාස්තුවද සමග ප්‍රාදේශීය ලේකම් වෙත බාරදීම.

04.ප්‍රාදේශීය ලේකම් විසින් ඉහත කරුණු සලකා බැලීමෙන් අනතුරුව ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම.

## හවුල් ව්‍යාපාර

1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ(1) වගන්තිය අනුව හවුල් ව්‍යාපාරයක් යන්න පහත පරිදි නිර්වචනය කර ඇත.

"ලාභ ලැබීමේ අරමුණින් ව්‍යාපාරයක් පවත්වාගෙන යන පුද්ගලයින් අතර පවත්නා සම්බන්ධය හවුල් ව්‍යාපාරයක් නම් වේ."

හවුල් ව්‍යාපාරයක අනිවාර්යයෙන්ම තිබිය යුතු ලක්ෂණ

01.ලාභ ලැබීමේ අරමුණක් තිබීම.

02. ව්‍යාපාර කටයුත්තක් පැවතීම.

03. පුද්ගලයින් සිටීම.

04. අන්‍යෝන්‍ය සම්බන්ධතාවක්(එකඟතාවක්) තිබීම.

හවුල් ව්‍යාපාරයක සුවිශේෂී ලක්ෂණ

01. හවුල්කරුවන් අවම සංඛ්‍යාව 02 වන අතර උපරිමය 20 කට සීමා වීම.

02. හවුල්කරුවන් අතර ගිවිසුමක් පැවතිය යුතු වීම.

03.ලාභ බෙදා ගැනීම සඳහා වූ යම් එකඟතාවක් පැවතීම.

04. සෑම හවුල්කරුවකුම තමාගේ හා සෙසු හවුල්කරුවන්ගේ නියෝජිතයෙකු හා ප්‍රධානියකු වශයෙන් සැලකීම.

05.කිසියම් ව්‍යාපාර කටයුත්තක් පැවතීම.

හවුල් ව්‍යාපාරයක මූලික ලක්ෂණ

අයිතිය:- හවුල්කරුවන් සතු වේ.අවමය දෙකයි උපරිමය විස්සයි.

ප්‍රාග්ධනය සැපයීම :- හවුල්කරුවන් සපයයි .

වගකීම:- වගකීම අසීමිතයි.

කලමණාකරණය:- එක් පුද්ගලයෙකු හෝ කිහිපදෙනෙකු විසින් සිදු කරයි.

ලාභ අලාභ:- ගිවිසුම අනුව ලාභ අලාභ බෙදා ගනියි.

පැවැත්ම:- අඛණ්ඩ පැවැත්මක් නොමැත.

ලියාපදිංචිය:- අනිවාර්ය නොවේ.

හවුල්කරුවන්ගේ සම්පූර්ණ නම් වලින් හැර වෙනත් නම්වලින් පවත්වාගෙන යයි නම් එය ලියාපදිංචි කළ යුතුය - 1918 ව්‍යාපාර නාම ආඥා පනතට අනුව

නීතිමය පුද්ගලභාවය:- නැත

හවුල්කරුවන්ගේ පෞද්ගලික නම්වලින් පෙනී සිටිය යුතුය .

ගිණුම් තැබීම හා විගණනය:- අනිවාර්යෙන් නොවෙයි .

විසුරුවා හැරීම :- ස්වේච්ඡාවෙන් හෝ අධිකරණය මගින් විසුරුවා හරී.

## හවුල් ගිවිසුම

හවුල්කරුවන් අතර ඇති කරගන්නා ලිඛිත ගිවිසුම හවුල් ඔප්පුව ලෙස හැඳින්වේ.එනම් හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් හවුල්කරුවන් අතර ඇති කරගන්නා නීත්‍යානුකූල කොන්දේසි අඩංගු ලියවිල්ලකි.

හවුල් ඔප්පුවක ඇතුළත් කරුණු

01.ව්‍යාපාරය පිළිබඳ මූලික තොරතුරු

උදා:- ව්‍යාපාරයේ නම,හවුල්කරුගේ නම හා ලිපිනයන්,ව්‍යාපාරයේ ස්වභාවය,ව්‍යාපාරය කාල සීමාව.

02:-ප්‍රාග්ධනය යෙදීම පිළිබඳ විස්තර.

03:- ලාභ අලාභ බෙදා ගන්නා ආකාරය පිළිබඳ තොරතුරු.

04:-ව්‍යාපාරයේ පරමාර්ථ .

05:- හවුල්කරුවන්ගේ ගැනිලි පිළිබඳ සීමා .

06:- ප්‍රාග්ධන පොලී හා ගැනිලි පොලී පිළිබඳ තොරතුරු .

07:- හවුල් ව්‍යාපාරය අවසන් කිරීම පිළිබඳ කොන්දේසි.

08:- නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේදී, සිටින හවුල්කරුවෙකු ඉවත් වීමේ දී හා හවුල්කරුවෙකුගේ මරණයේදී කටයුතු කරන ආකාරය පිළිබඳ.

හවුල් ඔප්පුවක් වැදගත් වීමට හේතු

01. හවුල්කරුවන් අතර මතභේද හා ආරවුල් විසදා ගැනීමට හැකිවීම.

02. හවුල් ව්‍යාපාරයේ කටයුතු පවත්වාගෙන යෑමේ දී පහසුවක් වීම.

03. නීතිය ඉදිරියේ බලාත්මක කලහැකි වීම.

## 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය

හවුල් ඔප්පුවක් නොමැති විටෙක(ලිඛිත ගිවිසුමක් නොමැති විට) හෝ ගිවිසුමේ සඳහන් නොවන කරුණු සම්බන්ධයෙන් ගැටලුවක් මතු වූ අවස්ථාවක 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තියට අනුව කටයුතු කළ යුතුය. එහි පහත සඳහන් කරුණු ඇතුළත් වේ.

1. හවුල් ව්‍යාපාරයේ ලාභ හා අලාභ හවුල්කරුවන් සමානව බෙදාගත යුතු අතර හවුල් ව්‍යාපාරය අවසන් කරන විට ප්‍රාග්ධනය සමානව බෙදාගැනීමට හවුල්කරුවන්ට ගිවිසුමක් ඇත.

2. ව්‍යාපාරය වෙනුවෙන් හවුල්කරුවන් පෞද්ගලිකව දරනු ලබන වියදම් ව්‍යාපාරය විසින් ඔවුන්ට ආපසු ගෙවිය යුතුය.

3. ගිවිසගත් ප්‍රාග්ධනයට අමතරව හවුල්කරුවන් විසින් සපයා ඇති මුදල් සඳහා 5% ක වාර්ෂික පොලියක් හිමිවේ.

4. ප්‍රාග්ධනය වෙනුවෙන් පොලියක් කිසිම හවුල්කරුවෙකුට හිමි නොවේ.

5. ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතු සඳහා සෑම හවුල්කරුවෙකුටම සහභාගී වීමට අයිතියක් ඇත.

6.කිසිම හවුල්කරුවෙකුට තම සේවය වෙනුවෙන් වේතනයක් ව්‍යාපාරයෙන් ලැබිය නොහැක.

7. කිසිම හවුල්කරුවෙකුට සියලුම හවුල්කරුවන්ගේ කැමැත්ත නොමැතිව නව හවුල්කරුවෙකු බඳවා ගත නොහැක.

8. හවුල් ව්‍යාපාර ගිණුම් පොත් ප්‍රධාන කාර්යාලයේ තැබිය යුතු අතර ඕනෑම අවස්ථාවක ඒවා පරීක්ෂා කිරීමට,පිටපත් කරගැනීමට සියලුම හවුල්කරුවන්ට අයිතියක් ඇත.

## හවුල් ව්‍යාපාර වර්ග

හවුල් ව්‍යාපාර මූලික වශයෙන් වර්ග දෙකකි.

01. සීමා රහිත හවුල් ව්‍යාපාර

ව්‍යාපාර වගකීම් නිදහස් කිරීමේදී සියලුම හවුල්කරුවන් අසීමිතව වගකීමට බැඳී සිටින හවුල් ව්‍යාපාර සීමා රහිත සීමාරහිත හවුල් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

02. සීමිත හවුල් ව්‍යාපාර

හවුල්කරුවන්ගේ වගකීම ඔවුන් යොදා ඇති ප්‍රාග්ධනයට පමණක් සීමා වන එහෙත් යටත් පිරිසෙන් වගකීම අසීමිත වන එක් හවුල්කරුවෙකු හෝ සිටින හවුල් ව්‍යාපාර සීමාසහිත හවුල් ව්‍යාපාර ලෙස හැඳින්වේ.

ශ්‍රී ලංකාවේ මෙවැනි හවුල් ව්‍යාපාර දැකිය නොහැක.

හවුල් ව්‍යාපාර ලෙස බහුලව සංවිධානය වී ඇති ව්‍යාපාර ක්ෂේත්‍ර

1.වෘත්තීය ව්‍යාපාර

වෘත්තීය ව්‍යාපාර අසීමිත වගකීම බෙදා හැරීම සඳහා හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීම වැදගත් වේ.

උ.දා:- විගණන ආයතන,වෛද්‍ය වෘත්තිය,නීතිඥ වෘත්තිය.

2. පුද්ගල කුසලතාව හා දැනුම මත පදනම් වූ ව්‍යාපාර

විවිධ දක්ෂතා ඇති පුද්ගලයන් අවශ්‍ය වන ව්‍යාපාර ද හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කළ හැක.

උ.දා:- ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපාර සඳහා සැලසුම් ශිල්පීන්, ඉංජිනේරුවන්, තක්සේරුකරුවන්, ගණකාධිකාරිවරන්

## හවුල් ව්‍යාපාර සඳහා බලපාන නීති මූලාශ්‍ර

01.1890 හවුල් ව්‍යාපාර ආඥා පනත

හවුල් ව්‍යාපාර ඇරඹීම, පවත්වාගෙන යාම හා විසුරුවා හැරීමට අදාළ මූලික නීතිමය ප්‍රතිදාන මෙන්ම හවුල් ඔප්පුවක් නොමැති අවස්ථාවක කටයුතු කළ යුතු ආකාරය දැක්වීම.

02. 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත

හවුල් ව්‍යාපාරයක ආරම්භක ප්‍රාග්ධනය රුපියල් 1000 ට වඩා වැඩි වූ විට ලිඛිත ගිවිසුමක් යටතේ හවුල් ගිවිසුම පවත්වාගෙන යා යුතුය.

03. 2007 අංක 7 දරණ සමාගම් දරන සමාගම් පනත

උපරිම හවුල්කරුවන් සංඛ්‍යාව විස්සකට සීමා කිරීම.

04. 1918 අංක 6 දරණ ව්‍යාපාර නාම ආඥා පනත

හවුල් ව්‍යාපාරයක් එම හවුල්කරුවන්ගේ සම්පූර්ණ නම් වලින් හැර වෙනත් නමකින් පවත්වාගෙන යන්නේ නම් එම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතුය.

05. සීමාසහිත හවුල් ව්‍යාපාර ආඥා පනත

සීමිත හවුල් ව්‍යාපාර සම්බන්ධයෙන් විස්තර දැක්වේ.

හවුල් ව්‍යාපාරයක වාසි

01:-පහසුවෙන් ආරම්භ කළ හැකි වීම.

02:- පහසුවෙන් විසුරුවා හැරීමට හැකි වීම.

03:-වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම.

04:-කිහිපදෙනෙකුගේ හැකියා හා දක්ෂතා ඒකරාශී කර ගත හැකි වීම.

05:-වගකීම කිහිපදෙනෙකු අතරේ බෙදී යාම.

06:-සාමූහික වගකීමක් ඇති නිසා උනන්දුවෙන් සහ කාර්යක්ෂමව කටයුතු කිරීම.

හවුල් ව්‍යාපාරයක අවාසි

01- අඛණ්ඩ පැවැත්මක් නොමැත.

02-නෛතික පුද්ගලභාවයක් නොමැත.

03- වගකීම අසීමිත වීම.

04- ලාභය හවුල්කරුවන් අතර බෙදී යාම.

05- හවුල්කරුවෙකුගේ ක්‍රියාකලාපය නිසා සියලුම හවුල්කරුවන් වගකීමට බැඳීම.

06- හවුල්කරුවන් අතර ඇතිවිය හැකි මතභේද හවුල් ව්‍යාපාරයට අහිතකර ලෙස බලපෑම.

කේවල ස්වාමි ව්‍යාපාරයකට වඩා හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරයක් ආරම්භ කරගෙන යාමේ වැදගත්කම

වගකීම හවුල්කරුවන් අතර බෙදී යාම නිසා කේවල ස්වාමි ව්‍යාපාරයක අයිතිකරුවන්ට වඩා හවුල් කරුවන්ගේ වගකීම අඩුය.

හවුල් ව්‍යාපාරයක සීමා

01.හවුල්කරුවන්ගේ වගකීම අසීමිත වීම.

02.හවුල්කරුවන් අතර ඇතිවිය හැකි මතභේද හවුල් ව්‍යාපාරයට අහිතකර ලෙස බලපෑම.

03. එක් හවුල්කරුවෙකුගේ ක්‍රියාකලාපය නිසා සියලූම හවුල්කරුවන් වගකීමට බැඳී ම.

04.අඛණ්ඩ පැවැත්මක් නොමැති වීම.

## කේවල ස්වාමි ව්‍යාපාරයක් හා හවුල් ව්‍යාපාරයක් සැසඳීම

01. කේවල ස්වාමි ව්‍යාපාරයක සාමාජික සංඛ්‍යාව එක් පුද්ගලයෙකි.හවුල් ව්‍යාපාරයක අවමය දෙකක් සහ උපරිමය විස්සක් වෙයි.

02. කේවල ස්වාමි ව්‍යාපාරයක ප්‍රාග්ධනය අයිතිකරුවන් විසින් යොදවයි, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් විසින් යොදවයි.

03. කේවල ස්වාමි ව්‍යාපාරයක වගකීම අසීමිතයි. හවුල් ව්‍යාපාරයක වගකීම් අසීමිතයි.

04. කේවල ස්වාමි ව්‍යාපාරයක පරිපාලනය අයිතිකරු විසින් සිදු කරයි,හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් එක්වී පරිපාලනය සිදුකරයි.

05:කේවල ස්වාමී ව්‍යාපාරයක අයිතිකරු සියලු ලාභ පාඩු විඳ දරයි, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන් අතර බෙදී යයි.

06.කේවල ස්වාමි ව්‍යාපාරයක අයිතිකරු විසින් තීරණ ගනියි, හවුල් ව්‍යාපාරයක සියලු හවුල්කරුවන් එක්වී තීරණ ගනී.

## හවුල්කරුවන් වර්ග

විවිධ අයිතිවාසිකම් සහිත විවිධාකාර හවුල්කරුවන්ට හවුල් ව්‍යාපාරයට සහභාගි වීමේ අවකාශය හවුල් ව්‍යවස්ථාවලියෙන් සැලසිය  හැකිය. ඒ අනුව හවුල්කරුවන් පහත පරිදි වර්ග කළ හැකිය.

1. සාමාන්‍ය හවුල්කරුවන්

ප්‍රාග්ධනයට දායකවන, කළමනාකරණ කටයුතු වලට දායක වන වගකීම් අසීමිත, මහජනයා හවුල් කරුවෙකු බව දන්නා හා සියලු ව්‍යාපාරික වරප්‍රසාද භුක්ති විඳින හවුල්කරුවෝ "සාමාන්‍ය හවුල්කරුවෝ" වේ.

2. ක්‍රියාකාරී හවුල්කරුවන්

හවුල් ව්‍යාපාරයේ  කළමනාකරණ කටයුතු සඳහා ක්‍රියාකාරීව සහභාගී වන වගකීම අසීමිත සාමාන්‍ය හවුල්කරුවෙකු  මින් අදහස් වේ. සාමාන්‍යයෙන් ලාභයට අමතරව වැටුපක් ලැබීමට ද ඉඩ තිබේ. මොහු හවුල් කරුවෙකු බව මහජනයා දනී.

3. නිද්‍රා/අක්‍රිය හවුල්කරුවන්

ප්‍රාග්ධනය යොදා, ලාභ පාඩු භුක්තිවිඳින, කළමනාකරණයට සහභාගී නොවන, හවුල්කරුවෙකු බව මහජනයා නොදන්නා, වගකීම අසීමිත හවුල්කරුවන් මින් අදහස් වේ .

4. සීමිත හවුල්කරුවන්

වගකීම තමා යෙදූ ප්‍රාග්ධනයට සීමා වන, සීමිත හවුල් ව්‍යාපාර වල සිටින හවුල්කරුවන් වේ. මොවුන් කළමනාකරණ කටයුතු වලට සහභාගී නොවන අතර හවුල්කරුවෙකු බව මහජනයා නොදනී.

5. නිහඬ හවුල්කරු

ව්‍යාපාරයට ප්‍රාග්ධනය යොදා ලාභ පාඩු භුක්තිවිඳින, වගකීම අසීමිත හවුල්කරුවන් ය. මොහු හවුල්කරුවෙකු බව මහජනයා දනී.

6. රහස්‍ය හවුල්කරු

ව්‍යාපාරයට ප්‍රාග්ධනය යොදා, ලාභ පාඩු භුක්තිවිඳින, කළමනාකරණයට සම්බන්ධ වන, වගකීම් අසීමිත හවුල්කරුවකු වේ.මොහු හවුල්කරුවකු බව මහජනයා නොදනී.

7. ආරූඪ හවුල්කරු

ප්‍රාග්ධනයට දායක නොවී ඒ වෙනුවෙන් ණය මුදලක් ලබා දී වාර්ෂික ලාභය මත වෙනස් වන පොලියකට හිමිකම් කියන හවුල්කරු වේ.ඇතැම් විට හවුල්කරු විශ්‍රාම යාමේදී ව්‍යාපාරයෙන් ලැබිය යුතු මුදල ණය මුදලක් ලෙස සපයයි. මොහු හවුල්කරුවෙකු බව මහජනයා දනී. අසීමිතව වගකියයි.

8. නාමමාත්‍ර හවුල්කරු

හවුල් ව්‍යාපාරයට ප්‍රාග්ධනය නොයොදා වෘත්තිය වශයෙන් හෝ ව්‍යාපාරිකයකු වශයෙන් දිනා සිටින සිය කීර්තිනාමය පමණක් යොදා ලාභ අලාභය භුක්තිවිඳින ව්‍යාපාර කළමනාකරණ කටයුතු සඳහා සම්බන්ධ නොවන, වගකීම අසීමිත හවුල්කරුවෙකි.

9. ප්‍රමුඛ හවුල්කරු

ධනය යොදා ලාභ පාඩු බුක්ති විඳිමින් අසීමිතව වගකියන හවුල් කරුවෙකි.හවුල් ඔප්පුවේ හෝ ව්‍යාපාරයට අදාල අනිකුත් ලියකියවිලි වල මුලින්ම නම සඳහන් හවුල්කරු වන අතර බදු ගෙවීම හෝ අනෙකුත් කටයුතු සම්බන්ධයෙන් මුලින්ම ඇමතුම් ලැබෙන්නේ මොහුටයි.

## හවුල් ව්‍යාපාර විසුරුවා හැරීම

හවුල් ව්‍යාපාර විසුරුවා හැරීම ආකාර දෙකකට සිදු කළ හැකිය.

1. හවුල විසුරුවා හැරීම.
2. හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම .

හවුල විසුරුවා හැරීම

හවුල්කරුවන් අතර පවත්නා සම්බන්ධතාවයේ කිසියම් වෙනසක් සිදුවීම හවුල විසුරුවා හැරීම ලෙස හැඳින්වෙයි. නව හවුල්කරුවෙකු බඳවා ගැනීමේදී හෝ විශ්‍රාම ගැනීමේදී පවතින හවුල් ගිවිසුම අහෝසි කර නව හවුල් ගිවිසුමක් ඇතිකර ගනී.මෙසේ පැවති හවුල් ගිවිසුම් අහෝසි කිරීම හවුල විසුරුවා හැරීම නම් වේ.මෙහිදී ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමක් සිදුවේ.

උ.දා:- ඞ ල ශ යන දෙදෙනා හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. මෙම හවුලට ' නව හවුල් කරුවෙකු ලෙස බඳවා ගන්නා ලදි.

මෙහිදී ඞ හා ශ අතර පැවති හවුල අවසන් කර ඞශ' ලෙස නව හවුල් ව්‍යාපාරයක් පවත්වාගෙන යයි.

හවුල් ව්‍යාපාරය විසුරුවා හැරීම

සේවාවෙන් හෝ අධිකරණය මගින් හවුලක් විසුරුවා හැරීමේදී හවුලේ සියලු ව්‍යාපාර කටයුතු නිමාවට පත් කිරීමට සිදුවේ. එය හවුල් ව්‍යාපාර ආයතන විසුරුවා හැරීම නම් වේ.

ස්වෙච්ඡාවෙන් හවුල් ව්‍යාපාරයක් විසුරුවා හරින අවස්ථා

01. නියමිත කාලයකට ආරම්භ කළේ නම් එම කාලය අවසන් වීම.

02. නියමිත කාර්යයකට ආරම්භ කළේ නම් එම කාර්යය අවසන් වීම.

03. අවිනිශ්චිත කාලයකට ආරම්භ කර තිබේ නම් හවුල් ව්‍යාපාර විසුරුවා හරින ලෙස එක් හවුල්කරුවෙකු විසින් අනෙක් හවුල්කරුවන්ට දැනුම් දීම.

04. හවුල්කරුවෙකුගේ මරණය හෝ බුන්වත් වීම .

05. හවුල්කරුවෙකුගේ බාහිර පෞද්ගලික ණයක් සඳහා ඔහුගේ ප්‍රාග්ධනය හිලව් කිරීමට සිදුවීම

06. හවුල් ව්‍යාපාරය නීති විරෝධී වීම.

අධිකරණය මගින් හවුල් ව්‍යාපාරයක් විසුරුවා හරින අවස්ථා

01. හවුල්කරුවෙකු උමතු වීම හෝ සදාකාලික සිහිවිකල් වීම.

02. හවුල් ව්‍යාපාරයේ තමාගේ කොටස ඉෂ්ට කිරීමට ස්ථිර වශයෙන් නොහැකි වන නිසා වන සිද්ධියක් සිදු වී ඇති විට / හවුල් කරුවෙකු ඔත්පල වීම.

03. හවුල් ව්‍යාපාරයේ හවුල්කරුවෙකු නීතිය ඉදිරියේ වරදකරුවකු වීම .

04. හවුල් ව්‍යාපාර දිගින් දිගටම පාඩු ලැබීම.

## සංස්ථාපිත සමාගම්

සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද පුද්ගලයන්ගේ එකතුවක් "සමාගමක් "ලෙස හැඳින්විය හැකිය. 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ එම ව්‍යාපාර සංවිධානය සංස්ථාපනය කරනු ලැබේ.

උ.දා:- සී/ස සිංහපුත්‍ර සමාගම

සී/ස අරලිය (පෞද්ගලික) සමාගම

සී/ස ප්‍රතිභා (පෞද්ගලික) සමාගම

සංස්ථාපිත සමාගම් වල සුවිශේෂී ලක්ෂණ

* සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද ස්වාධීන ආයතනයක් වීම.

* සමාගමක් එහි සාමාජිකයන්ගෙන් වෙන්වූ නීතිමය ඒකකයක් වීම.

* අඛණ්ඩ පැවැත්ම හෙවත් නිත්‍ය සන්තතික හැකියාවක් තිබීම .

* අයිතිකරුවන්ගේ වගකීම සීමාසහිත වීම.

* කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය සම්පාදනය කර ගැනීම .

* කොටස් පැවරීමේ හැකියාව පැවතීම.

* කළමනාකරණය අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදු වීම.

ස්ථාපිත සමාගම්වල වාසි(සී/ස සමාගම්වල වාසි)

1.විශාල ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම.

2. මහා පරිමාණ ව්‍යාපාර ආරම්භ කළ හැකි වීම.

3. දක්ෂ කළමනාකරුවන් බඳවාගෙන ව්‍යාපාර කටයුතු කරගෙන යා හැකි වීම.

4. කොටස්කරුවන්ගේ වගකීම සීමා සහිත වීම නිසා ආයෝජකයන් ආකර්ශණය කර ගත හැකි වීම.

5. කොටස්කරුවෙකුගේ මරණය  හෝ ඉවත්වීම ව්‍යාපාරයේ පැවැත්මට හානියක් නොවී ම.

6.ඉහළ මට්ටමක මානව සම්පත් ඒකරාශී කර ගත හැකි වීම .

7. ව්‍යාපාරයට නීතිමය  පුද්ගල භාවයක් තිබීම.

සීමාසහිත සමාගම් වල අවාසි

1. නීතිමය බලපෑම දැඩි වීම.

2. ආරම්භ කිරීමට සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළ යුතු වීම හා ඒ සඳහා පිරිවැයක් දැරිය යුතු වීම.

3. කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමිවීම (ඡධඨ ජඨර ධණ්ඒ්යඇර් ) සහ සුළු කොටස්කරුවන්ට වැඩි  බලයක් හිමි නොවේ.

4. සමාගමේ ලාභය මත මෙන්ම කොටස්කරුවන්ට හිමිවන ලාභාංශය මතද බදු ගෙවීමට සිදුවීම නිසා ලාභ ද්විත්ව  බදු ගණනයකට හසුවීම.

5. විසුරුවාහැරීමකදී වුව ද සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කිරීමට සිදුවීම.

6. කළමනාකරණය සංකීර්ණ වීම හා දුෂ්කර වීම.

**සමාගම් සංස්ථාපනය(ලියාපදිංචි ) කිරීම.**

සමාගමක් සංස්ථාපනය කිරීම අදාළ රටේ සමාගම් පනතට අනුව කළ යුතු අතර ශ්‍රී ලංකාවේ සමාගම් සංස්ථාපනය කිරීම 2007 අංක 7 දරණ සමාගම් පනතට අනුව සමාගම් රෙජිස්ටාර් දෙපාර්තමේන්තුවේ සමාගම් රෙජිස්ටාර්වරයා වෙත සිදුකළ යුතුය.

සමාගමක් සංස්ථාපනය කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය

1. සමාගම් නාමය ලියාපදිංචි කිරීම

සමාගමේ යෝජිත නාමය දැනට පවත්නා සමාගමක නාමයට අනුරූප නොවන හෝ සමාන නොවන බවට තීරණය වූ පසු ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කළ යුතුය.මෙහිදී නාමය අනුමත කිරීමේදී අදාළ පෝරමය පුරවා අදාල ගාස්තුව සමග තොරතුරු කවුළුවට ඉදිරිපත් කිරීමෙන් අනුමත කරන ලද නාමයේ අංකය ලබා ගත යුතුය.සමාගමේ නාමය ලියාපදිංචි කිරීමෙන් පසු පහත ලියවිලි සමාගම සංස්ථාපනය සඳහා ඉදිරිපත් කළ යුතුය.

1. සමාගම ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍රය.

2. සමාගමේ   සාංගමික ව්‍යවස්ථාවලිය .

3. සමාගමේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ක්‍රියා කිරීමට ක්‍රියාකිරීමට එක් එක් ආරම්භක අධ්‍යක්ෂකවරයාගේ කැමැත්ත දැක්වෙන ප්‍රකාශය .

4. සමාගමේ ලේකම්වරයා ලෙස ක්‍රියා කිරීමට කැමති බවට ආරම්භක ලේකම්වරයාගේ ප්‍රකාශය.

අදාල සියළු ලියවිලි නිවැරදි බවට තහවුරු වූ පසු හා නියමිත ගාස්තු ගෙවීමෙන් පසු සමාගම් රෙජිස්ට්‍රාර්වරයා සංස්ථාපන සහතිකය නිකුත් කරයි. සංස්ථාගත කිරීමේ සහතිකය ලැබීමෙන් පසුව වැඩ කරන දින 30 ක් ඇතුලත සමාගමේ නම, අංකය හා ලියාපදිංචි ලිපිනය ඇතුළත්ව සංස්ථා ගත කළ බව සඳහන් දැන්වීමක් රජයේ ගැසට් පත්‍රයේ හා පොත්පත් වල සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පළ කළ යුතුය.

## 2007 අංක 7 දරණ සමාගම් පනත යටතේ සංස්ථාපනය කළ හැකි සමාගම් වර්ග

සීමාසහිත සමාගම්

කොටස්කරුවන් මිලදී ගත් කොටස් වෙනුවෙන් ගෙවි හෝ ගෙවීමට බැඳී සිටින වටිනාකමට පමණක් ඔවුන්ගේ වගකීම සීමාවන සමාගම් සීමාසහිත සමාගම් ලෙස හැඳින්වේ.

සීමාසහිත සමාගම් කොටස් තුනකි.

### 1.සීමිත පෞද්ගලික සමාගම්

කොටස් හෝ වෙනත් සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කිරීමට අවසර නොමැති අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හෝ උපරිම සංඛ්‍යාව 50ක් වන සමාගම් සීමිත පෞද්ගලික සමාගම් ලෙස හැඳින්වේ.

සීමාසහිත පෞද්ගලික සමාගමක ප්‍රධාන ලක්ෂණ

1. අයිතිය - කොටස්කරුවන් සතුවෙයි .

2. ප්‍රාග්ධනය- කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය සපයා ගනියි .ප්‍රසිද්ධියේ කොටස් හා ණයකර මිලදී ගැනීමට මහජනයාට ආරාධනා කිරීම තහනම් වේ.

3. කොටස්කරුවන් සංඛ්‍යාව- අවමය එකක් වන අතර උපරිම සංඛ්‍යාව 50 කට සීමා වේ. මෙම උපරිම ප්‍රමාණයට සේවා නියුක්තිකයන් වන කොටස් හිමියන් හා සේවා නියුක්ත වී සිටියදී කොටස් මිල දී ගත් දැනට සේවයෙන් ඉවත් වී ඇති කොටස් හිමියන් අයත් නොවේ.

4. කළමනාකරණය - මෙය අධ්‍යක්ෂ මණ්ඩලයකින් සමන්විත වේ.

අවම අධ්‍යක්ෂකවරුන් සංඛ්‍යාව එකක් වන අතර උපරිමය පිළිබඳ සීමාවක් නැත.

5. පාලනය -ව්‍යවස්ථාපිත පාලනයට හා කොටස්කරුවන්ගේ සාමූහික පාලනයට යටත් වීම.

6. නෛතික පුද්ගලභාවය- නෛතික පුද්ගලභාවයක් පැවැත්වීම.

7. වගකීම් - සීමිත වගකීමක් ඇත.

8. පැවැත්ම - අඛණ්ඩ පැවැත්මක් තිබීම.

9. සංස්ථාපනය - සමාගම් රෙජිස්ටාර් කාර්යාලයේ සංස්ථාපනය කිරීම.

10. ගිණුම් තැබීම හා විගණනය- අනිවාර්ය වේ

11. බදු ගෙවීම - සමාගමේ නමින් බදු ගෙවිය යුතුය.

12. ඈවර කිරීම - ස්වේච්ඡාවෙන්, අධිකරණ නියෝගයකින් හා අධිකරණ අධීක්ෂණය යටතේ.

13. සමාගම් නාමය- සමාගමේ නම සඳහන් කිරීමේදී නම මුලට සීමා සහිත හෝ එහි කෙටි යෙදුම වන (සී/ස) යන හා අගට යෙදෙන සමාගම් යන වචනයට පූර්වයෙන් පෞද්ගලික හෝ එහි කෙටි යෙදුම වන(පෞද්)යෙදිය යුතුය.

14. ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයකින් තොරව සියලුම කොටස්කරුවන්ගේ කැමැත්ත මත ලාභාංශ බෙදා හැරිය හැකිය.

ශ්‍රී ලංකා විදුලි (පෞද්ගලික) සමාගම

චාන්දනී බේකර්ස් (ඡඩඑ බඑා)

සී/ස සමරසිරි (පෞද්ගලික )සමාගම

ලංකා කලේර් (ඡඩඑ බඑා)

සීමාසහිත පෞද්ගලික සමාගම්වල වාසි හා අවාසි

වාසි

1.ලාභය සීමිත පිරිසක් අතර බෙදී යාම.

2. ආරම්භ කිරීම පහසු වීම .

3.වගකීම සීමිත වීම.

4.නීතිමය පුද්ගලභාවය පැවතීම.

5. සෙසු සමාගම් වලට සාපේක්ෂව නීතිමය බලපෑම අඩු වීම.

6. අඛණ්ඩ පැවැත්මක් පැවතීම.

අවාසි

1. උපරිම සාමාජික සංඛ්‍යාව 50 ට සීමා වීම.

2. කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කළ නොහැකි වීම.

3. කොටස් වෙළෙඳපොළට පිවිස නිල ලයිස්තු ගත සමාගමක් විය නොහැකිවීම.

4. කොටස් නිදහසේ පැවරිය නොහැකි වීම.

5. සමාගම් පනතේ නීතිමය අවශ්‍යතා ඉටු කළ යුතු වීම.

6. පරිපාලන වියදම් වැඩිවීම.

## සීමා සහිත පොදු සමාගම්

කොටස් හා ණයකර ප්‍රසිද්ධිය මහජනයාට නිකුත් කිරීමට අවසර ඇති අවම කොටස්කරුවන් සංඛ්‍යාව එකක් හා උපරිමය සීමාවක් නොමැති සමාගම් සීමිත පොදු සමාගම් ලෙස හැඳින්වේ .

සීමාසහිත පොදු සමාගමක ලක්ෂණ

1. අයිතිය- කොටස්කරුවන් සතුවේ .

2. කොටස් නිකුත් කිරීමෙන් ප්‍රාග්ධනය සපයා ගනී. කොටස් හා සුරැකුම්පත් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම.

3.කොටස්කරුවන් සංඛ්‍යාව- අවමය එකක් වේ. උපරිමය පිළිබඳ සීමාවක් නොමැත.

4. කොටස් පැවරීම - කොටස් නිදහසේ පැවරිය හැකි වීම.

5.කළමනාකරණය - අධ්‍යක්ෂ මණ්ඩලයක් මගින් සිදුවේ. අවම අධ්‍යක්ෂකවරු දෙදෙනෙක් වන අතර උපරිමය පිළිබඳ සීමාවක් නොමැත.

6.- පාලනය - ව්‍යවස්ථාපිත පාලනයට හා කොටස්කරුවන්ගේ සාමූහික පාලනයට යටත් වීම.

7. නෛතික පුද්ගලභාවය - නෛතික පුද්ගලභාවයක් පැවතීම.

8. වගකීම- සීමිත වේ.

9. පැවැත්ම - අඛණ්ඩ පැවැත්ම පැවැත්මක් ඇත .

10. ස්ථාපනය - සමාගම් රෙජිස්ටාර් කාර්යාලයේ සංස්ථාපනය අනිවාර්ය වීම.

11. ගිණුම් තැබීම හා විගණනය- අනිවාර්‍ය වේ.

12. බදු ගෙවීම- සමාගමේ නමින් බදු ගෙවිය යුතුය.

13. ඈවර කිරීම - අධිකරණ නියෝගයක් මගින් අධිකරණයේ අධීක්ෂණයට යටත්ව .

14.සමාගමේ නාමය- නම සඳහන් කිරීමේ දී සීමාසහිත කෙටි යෙදුම වන සී/ස යෙදිය යුතුය.

Ceylinco PLC

DFCC Bank PLC

15. කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පර්යේෂණයක් කළ යුතුය.

සීමාසහිත සහිත පොදු සමාගම් වර්ග

සීමා සහිත පොදු සමාගම් කොටස් දෙකකට බෙදේ.

1. ලැයිස්තුගත පොදු සමාගම්(මිල කල සමාගම් )

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත පොදු සමාගම් මිලකළ (ලැයිස්තුගත සමාගම්) ලෙස හැඳින්වේ .

Ceylinco PLC, DFCC Bank PLC

2. ලැයිස්තුගත නොවූ පොදු සමාගම් (මිල නොකළ සමාගම්)

කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නොවූ සමාගම් මිල ලැයිස්තුගත නොවන සමාගම් ලෙස හැඳින්වේ.

Ceylon Biscuits Company

සී/ස මැලිබන් බිස්කට් සමාගම

සීමා සහිත පොදු සමාගම් වල වාසි

*විශාල ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම.

* කොටස් නිදහසේ පැවරිය හැකි වීම.

* කොටස් වෙළඳපොළට පිවිස මිල ලැයිස්තුගත සමාගමක් බවට පත්විය හැකි වීම.

* ඉහළ පිළිගැනීමක් ලැබීම.

* කළමනාකරුවන් ඉහළ වැටුප් යටතේ බඳවා ගෙන ව්‍යාපාර කටයුතු කරගෙන යා හැකි වීම/ **ඉහළ මට්ටමේ මානව සම්පත් ඒකරාශී කළ හැකි වීම .**

* ණය ප්‍රාග්ධනය ලබා ගැනීමේ පහසුව/ ණයකර ප්‍රසිද්ධියෙ නිකුත් කළ හැකි වීම.

අවාසි

* අලාභ ව්‍යාපාරය තුළම රැඳී ම.

* නීතිමය බලපෑම අධික වීම.

*ලාභය වැඩි පිරිසක් අතර බෙදී යෑම.

* කළමනාකරණය සංකීර්ණ වීම හා දුෂ්කර වීම .

* කොටස් සංඛ්‍යාව මත ඡන්ද බලය හිමිවන නිසා සුළු කොටස්කරුවන්ට වැඩි බලයක් හිමි නොවීම.

* ආරම්භ කිරීමේදී සංකීර්ණ ක්‍රියාදාමයක් අනුගමනය කළ යුතු වීම හා ආරම්භක වියදම් හා පරිපාලන වියදම් අධිකවීම.

සීමිත පෞද්ගලික සමාගමක් හා සීමිත පොදු සමාගමක් අතර වෙනස්කම්

1. සීමා සහිත පොදු සමාගම් වල සාමාජිකයන් අවමය එකක් හා උපරිමය 50ක් වේ. සීමා සහිත පොදු සමාගම් වල අවමය එකක් හා උපරිම සීමාවක් නොමැත.

2. සීමාසහිත පෞද්ගලික සමාගම් වල කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කළ නොහැකිය. සීමා සහිත පොදු සමාගම් වල ප්‍රසිද්ධියේ කොටස් නිකුත් කළ හැකියි .

3. සීමාසහිත පෞද්ගලික සමාගම් වල නිදහසේ කොටස් පැවරිය නොහැකිය. සීමා සහිත පොදු සමාගම් වල කොටස් නිදහසේ පැවරිය හැකිය.

4. සීමාසහිත පෞද්ගලික සමාගම් කොටස් වෙළෙඳපොළේ ලැයිස්තුගත වී නැත.සීමා සහිත පොදු සමාගම් ලැයිස්ගත වී ඇත.

5. සීමාසහිත පෞද්ගලික සමාගම්වල අවම අධ්‍යක්ෂවරුන් ගණන එක්කෙනෙකි. සීමා සහිත පොදු සමාගම් වල අධ්‍යක්ෂකවරු ගණන දෙදෙනෙකි.

6. සීමාසහිත පෞද්ගලික සමාගම් වල නම සඳහන් කිරීමේදී අගට යෙදෙන සමාගම යන වචනයට කලින් (පෞද්ගලික) හෝ(පෞද්) යෙදිය යුතුය.ලැයිස්තුගත සමාගමක් නොවන විටදී නම සඳහන් කිරීමේදී අගට යෙදෙන සමාගම් යන වචනයට කලින් (පොදු) යන්න යෙදිය යුතු නොවේ.

7.සීමාසහිත පෞද්ගලික සමාගමක ගිණුම් තැබීම අනිවාර්ය නොවෙයි. (සමාගමේ රෙජිස්ට්‍රාර්වරයෙකු ඉල්ලුවොත් පමණි)

සීමිත පොදු සමාගම් වලින් ආර්ථිකයට අත්වන ප්‍රතිලාභ මොනවාද?

* රැකියා උත්පාදනය කිරීම.

* තරඟකාරීත්වයට මුහුණදීමට හැකි වීම .

* නවෝත්පාදන සිදුකිරීමට ඉඩ ලැබීම.

* කොටස් වෙළෙඳපොළ තුළ ලියාපදිංචි පොදු සමාගම් සංඛ්‍යාව වැඩි වීමෙන් කොටස් වෙළෙඳපොළ සංවර්ධනය වීම .

*දළ දේශීය නිෂ්පාදනයට දායක වීම.

* කොටස් වෙළෙඳපොළ සංවර්ධනය වීමෙන් ජනතාවගේ ඉතුරුම් ඉහළ යාම .

කොටස් හිමියා

සමාගමේ කොටස් එකක් හෝ ඊට වැඩි ගණනක් තත් කාලයේ දරණ කොටස් නාම ලේඛනයේ නම ඇතුළත් තැනැත්තෙක් "කොටස් හිමියා" ලෙස හැඳින්වේ.

සීමිත පොදු සමාගමක කොටස් හිමියකු සතු අයිතිවාසිකම්

1. ලාභාංශ ලැබීම.

2. ඡන්ද බලය/ඡන්දය පාවිච්චි කිරීමේ අයිතිය.

3. ඈවර කිරීමේදී අතිරික්ත වත්කම් වලට හිමිකම් පෑම.

4. රැස්වීම් වලට සහභාගි වීම හා යෝජනා ඉදිරිපත් කිරීම.

5. අධ්‍යක්ෂකවරයෙකු ලෙස තේරී පත්වීම.

6. තමා වෙනුවෙන් ප්‍රතියුක්තකයෙකු නම් කිරීම.

7. කොටස්වල අයිතිය පැවරීම ට.

8. ගිණුම් වාර්තා පරීක්ෂා කිරීම හා පිටපත් ලබා ගැනීම.

9. සමාගමට හෝ අධ්‍යක්ෂකවරුන්ට එරෙහිව නඩු පැවරීමට.

කොටස් හිමියකු සතු යුතුකම්

1. රැස්වීම් වලට නිසි පරිදි සහභාගී වීම.

2.ලාභාංශ ප්‍රකාශ කර නොමැති විටෙක එය විඳ දරා ගැනීම.

3.සමාගමේ කටයුතු ගැන සැලකිලිමත් වීම.

4.කොටස් සඳහා මේ දක්වා නොගෙවූ ප්‍රමාණය ඉල්ලූ විට ලබා දීම.

5. සාංගමික ව්‍යවස්ථාවලියට අනුව කටයුතු කිරීම .

**සංස්ථා ප්‍රකාශනය**

සීමා සහිත පොදු සමාගම් වල කොටස් හෝ සුරැකුම්පත් මිලදී ගැනීමට ආරාධනා කරමින් මහජනයාට නිකුත් කරන ලියවිල්ල "සංස්ථා ප්‍රකාශනය"නම් වේ. මෙය දැන්වීමක් චක්‍රලේඛයක්, ප්‍රචාරණ දැන්වීමක් හෝ වෙනත් ආරාධනයක් විය හැකිය .

සාංගමික ව්‍යවස්ථාවලිය

- සමාගමක පරිපාලනයට අදාළ විධිවිධාන ඇතුළත් ප්‍රධාන ලියවිල්ල "සාංගමික ව්‍යවස්ථාවලිය "නම් වේ.
- සමාගමක් සංස්ථාපනයට අවශ්‍ය ප්‍රධාන ලියවිල්ල වන්නේ සාංගමික ව්‍යවස්ථාවලියයි.

සාංගමික ව්‍යවස්ථාවලියේ ඇතුළත් ප්‍රදානය කරුණු

1. සමාගමේ පරමාර්ථ.

2. කොටස් හිමියන්ගෙ අයිතිවාසිකම් හා බැඳීම්.

3.සමාගමේ කළමනාකරණය හා පරිපාලනය .

සමාගමික ව්‍යවස්ථාවලිය සකස් කිරීමේදී ඇතුළත් කළ යුතු අනිවාර්ය වගන්ති,

1. කොටස් සම්බන්ධව

   - කොටස් නිකුත් කිරීම
   - කොටස් ඇරයුම් කිරීම

2. කොටස් හිමියන්ගේ රැස්වීම් වලට අදාල අදාළ රීති

    ෆ කොටස් හිමියන්ගේ රැස්වීම් පිළිබඳ දැන්වීම්.

    ෆ රැස්වීම් පැවැත්වීමේ ක්‍රම.

    ෆ ඡන්දය දීම.

    ෆ කොටස් හිමිකරු යෝජනා.

3. අධ්‍යක්ෂකවරු හා ලේකම්

    ෆ අධ්‍යක්ෂකවරු පත් කිරීම හා ඉවත් කිරීම.

4. ගිණුම් හා විගණනය

    ෆගිණුම් වාර්තා, මූල්‍ය ප්‍රකාශ විගණනය ආදිය.

5. ඈවර කිරීම හා ලේඛනයෙන් ඉවත් කිරීම.

6. වෙනත් / විවිධ

    ෆ සමාගමේ නාමයේ පිළිබඳව.

    ෆ සමාගම විසින් තැබිය යුතු ලේඛන වර්ග.

    ෆ රක්ෂණය හා වන්දි පූර්ණය.

## සංස්ථාපන සහතිකය

සම්මුති සහතිකය, සංස්ථාගත සහතිකය යන නමින් හැඳින්වෙන මෙය කිසියම් සමාගමක් හෝ සමාගමක් ලෙස ලියාපදිංචි කළ බවට එම සමාගම වෙත සමාගම් රෙජිස්ට්‍රාර්වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයයි.

සංස්ථාපන සහතිකයක අඩංගු තොරතුරු

1. සමාගමේ නම හා අංකය
2. සමාගම සංස්ථා ගත කළ දිනය
3. සමාගම සීමා සහිත, සීමා රහිත හෝ ඇපයෙන් සීමිත සමාගමක්ද යන වග.
4. සමාගම පුද්ගලික සමාගමක්ද යන වග
5. සමාගම අක්වෙරළ සමාගමක්ද යන වග.

## කොටස් සහතිකය

සමාගමේ නිශ්චිත කොටස් ප්‍රමාණයක් මිලට ගෙන ඇති බවත් ඔහු සමාගමේ සාමාජිකයෙකු බවත් දක්වමින් දැනට ගෙවා ඇති වටිනාකමට ඔහුගේ නමින් සමාගමේ නිල මුද්‍රාව සහ ලේකම් හා අධ්‍යක්ෂකවරයෙකුගේ අත්සන් සහිතව නිකුත් කරන ලියවිල්ල "කොටස් සහතිකයයි."

## අවම සහභාගය

අධ්‍යක්ෂකවරුන්ගේ මතය අනුව කොටස් ප්‍රාග්ධනය නිකුත් කිරීමෙන් ලාභ ලබාගත යුතු අවම ප්‍රාග්ධන ප්‍රමාණය ලෙස සංස්ථා ප්‍රකාශයෙහි සඳහන් වන්නා වූ ප්‍රාග්ධන ප්‍රමාණය අවම සහභාගය ලෙස හැඳින්වේ. මෙසේ දක්වා ඇති අවම මුදල ඉල්ලුම් කිරීමේදී ලැබී තිබේ නම් මිස මහජනයා වෙත සමාගමක් විසින් අර්පණය කරනු ලැබූ යම් කොටස් ප්‍රාග්ධනයක් විභජනය නොකළ යුතුය.

අවම සහභාගය මගින් ආවරණය කරන වියදම්

1. ස්ථාවර වත්කම් මිලදී ගැනීම.

2.ආරම්භක වියදම් පියවීම.

3. ඉහත කරුණක් සඳහා ගත් ණයක් පියවීම.

4. කාරක ප්‍රාග්ධනය සපයා ගැනීම.

## කොටස් ප්‍රාරක්ෂණය

සීමිත පොදු සමාගමක් කොටස් නිකුතුව මගින් අවම කොටස් ප්‍රමාණයක් අවම සහභාගය සඳහා මහජනයා සහභාගී නොවුණහොත් එම ප්‍රමාණය මිලදී ගැනීම සඳහා මූල්‍ය ආයතනයක් සමග ඇතිකර ගන්නා ගිවිසුම කොටස් ප්‍රාරක්ෂණය ලෙස හැඳින්වේ. අවම සහභාගයට නොඅඩු මුදලක් රැස් කර ගැනීමට මෙය වැදගත්වෙයි.

කදපපැරජස්ක ඊබන දං සැහකදබ ඡබක

ඡ්එඑදබ හ්එසදබ්ක ඊබන ඡබක

ඵැරජය්බඑ ඊබන ඡබක

## ප්‍රතියුක්තකයා/ පෙරකලාසිකරු

කිසියම් රැස්වීමකට කොටස් හිමියකුට පැමිණීමට නොහැකි අවස්ථාවකදී ඔහු වෙනුවෙන් ඡන්දය දීමට වෙනත් තැනැත්තෙකු පත් කරයි. ඔහු ප්‍රතියුක්තකයා ලෙස හඳුන්වයි.

කොටස් හිමියකු විසින් ප්‍රතියුක්තකයකු පත්කරන්නේ නම් ඒ සඳහා නියමිත සාධන පත්‍රයක් හෙවත් ප්‍රතියුක්ත පත්‍රයක් සම්පූර්ණ කර එමගින් බලය පවරා දිය යුතුය.

සමාගම්වල රැස්වීම්

එක් එක් ලිත් වර්ෂයකට වරක් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කැඳවන කොටස් හිමියන්ගේ රැස්වීම මේ නමින් හැඳින්වේ. සමාගමක ශේෂපත්‍ර දිනයේ සිට මාසෙකට වඩා පසු නොවන සහ පූර්ව වාර්ෂික මහා සභා රැස්වීමෙන් පසු මාස පහළොවක් පසු නොවන දිනයක දී මෙම රැස්වීම පැවැත්විය යුතුය.

සීමා සහිත පොදු සමාගමක වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්වීමට හේතු

1- පනතේ විධි විධානයන්ට අනුව කටයුතු කිරීමට සිදුවීම.

2- ගත වූ මූල්‍ය වර්ෂයේ ප්‍රගතිය කොටස්කරුවන්ට දැනුම්දීම .

3- ඉදිරි වර්ෂයේ සැලසුම් දැනුම්දීම.

4- ගත වූ මූල්‍ය වර්ෂය සඳහා අධ්‍යක්ෂ වාර්තාව හා විගණන වාර්තාව සභාගත කිරීම.

5- වාර්ෂික ගිණුම් වාර්තා අනුමත කර ගැනීම.

අති විශේෂ මහාසභා රැස්වීම

ඡන්ද සංඛ්‍යාවෙන් 10% නොඅඩු ඡන්ද හිමිකම තිබෙන කොටස් ප්‍රමාණයක් දරණ කොටස් හිමියන් විසින් කරන ලද ඉල්ලීමක් පරිදි සමාගමේ අධ්‍යක්ෂකවරුන් විසින් මෙම රැස්වීම කැඳවනු ලැබේ.

අති විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්වීමේ අරමුණ වන්නේ ,

සියලු සාමාජිකයන් විසින් නිශ්චය කළ යුතු විශේෂ කරුණක් මතු වූ විට හෝ වාර්ෂික මහාසභා රැස්වීමේදී සාකච්ඡා නොකළ කරුණු සලකා බැලීම සඳහායි.

සමාගමක පවත්වනු ලබන රැස්වීම්වලදී සාමාන්‍ය සහ විශේෂ යෝජනා සම්මත කර ගනී. සමාගමක බැරකම් පියවීමට නොහැකිව සමාගම විසුරුවා හැරීමේදී සමාගම ඒකාබද්ධ කිරීමේදීත් විශේෂ යෝජනා සම්මත කර ගනී. අධ්‍යක්ෂකවරු පත්කර ගැනීමේදී ලාභාංශ අනුමත කර ගැනීමේදී සාමාන්‍ය යෝජනා මගින් සම්මත කරගත යුතුයි.

## සමාගමක් විසිරුවා හැරීම

සමාගමක් ප්‍රධාන ක්‍රම 3ක් යටතේ විසුරුවා හැරිය හැකිය.

1. ස්වේච්ඡාවෙන් විසිරුවා හැරීම.

2. අධිකරණය මගින් විසුරුවා හැරීම .

3. අධිකරණයේ අධීක්ෂණයට යටත්ව විසිරුවා හැරීම.

01. ස්වේච්ඡාවෙන් විසුරුවා හැරීම,

1. සමාගමේ ව්‍යවස්ථාවලිය මගින් සමාගම යම් කාල සීමාවක් සඳහා ආරම්භ කර ඇති විට එකී කාල සීමාව අවසන් වීම.

2. සමාගම ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමිය යුතු බවට විශේෂ යෝජනාවක් සම්මත කර ගනු ලැබූ විට.

3.බැරකම් හේතුවෙන් තවදුරටත් සමාගම පවත්වාගෙන යාමට නොහැකි විට සමාගම වසා දැමිය යුතුයැයි විශේෂ යෝජනාවක් සම්මත වීම.

02. අධිකරණය මගින් විසුරුවා හැරීම.

෴ අධිකරණය මඟින් ගණන් බේරා වසා දැමිය යුතුයැයි විශේෂ යෝජනාවක් සම්මත කර ගැනීම.

- සංස්ථාගත කළ දින සිට වසරක් ඇතුළත ව්‍යාපාර කටයුතු ආරම්භ නොකිරීම.
- සමාගමේ අවම සාමාජික සංඛ්‍යාවක් නොසිටීම.
- සමාගමේ කිසිදු අධ්‍යක්ෂකවරයකු නොසිටීම.
- සමාගමට එහි ණය ගෙවීමට නොහැකි වීම.
- සමාගම ගණන් බේරා වසා දැමීම සාධාරණ සහ යුක්තිසහගත බව අධිකරණයේ මතය වීම.

03. අධිකරණයේ අධීක්ෂණයට යටත්ව විසිරුවා හැරීම.

ස්වෙච්ඡාවෙන් ගණන් බේරා විසුරුවා හැරීමට යෝජනාවක් සම්මත කර ඇති විටෙක එය අධිකරණයේ අධීක්ෂණය යටතේ සිදු කරනු ලබන ලෙස ණයහිමියන් හා වෙනත් පාර්ශවයන් ඉල්ලුම් කර ඇති විට අධිකරණයේ අධීක්ෂණයට යටත්ව සමාගම විසුරුවා හරිනු ලැබේ.

## සීමා රහිත සමාගම්

කොටස්කරුවන්ගේ වගකීම අසීමිත වේ.සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් පරිදි කොටස්කරුවන්ට නිකුත් කරන ලද කොටස් වල වටිනාකමට ඔවුන්ගේ වගකීම සීමා නොවන සමාගම් සීමාරහිත සමාගම් වේ.

## ඇපයෙන් සීමිත සමාගම්

කොටස් නිකුත් කිරීමක් සිදු නොකරන සාමාජිකයින්ගේ වගකීම සාංගමික ව්‍යවස්ථාවලියේ සඳහන් කර ඇති ඇප වටිනාකමට සීමා වන සමාගම් වේ.

උ.දා:- කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව( ඇපකාර සමාගම )

ඇපයෙන් සීමිත සමාගම් වල ලක්ෂණ

- කොටස් නිකුත් කිරීමක් සිදු නොකිරීම.
- සාංගමික ව්‍යවස්ථාවලියේ එක් එක් සාමාජිකයා විසින් සමාගම ඈවර කිරීමකදී දායක විය යුතු ප්‍රමාණය සඳහන් කළ යුතු වීම.
- අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකු සිටිය යුතු අතර උපරිමය පිළිබඳ සීමාවක් නැත.
- පොදු පරමාර්ථ පෙරදැරි කරගෙන ආරම්භ කිරීම.
- සමාගමේ ලාභ බෙදා හැරීමක් නොකිරීම.

## අක්වෙරළ සමාගම්

යම් විදේශීය රටක නීතිය යටතේ සංස්ථාපනය කරන ලද සමාගමක් හෝ සංස්ථාගත මණ්ඩලයක් ශ්‍රී ලංකාවෙන් පිටත ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මෙරට සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති නම් ඒවා අක්වෙරළ සමාගම් ලෙස හැඳින්වේ. මේ අනුව මේවා ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කළ ද ශ්‍රී ලංකාව තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට හිමිකමක් නැත.

අක් වෙරළ සමාගම් ශ්‍රී ලංකාවට වැදගත් වීමට හේතු :

- ලියාපදිංචි ගාස්තු ලෙස සහ ලාභාංශ මගින් විදේශ විනිමය ගලා ඒම.
- ශ්‍රී ලංකාවේ ගොඩනැගිලි භාවිතය නිසා ඒවාට බදුකුලී දේපල වැනි ආදායම් ලැබීම.
- ශ්‍රී ලාංකිකයන්ට දෙස් විදෙස් රැකියා අවස්ථා හිමිවීම.
- ශ්‍රී ලංකා නාමය විදේශ රටවල පැතිරීම.

## විදේශ සමාගම්

ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකාව ඇතුළත ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා මෙරට සමාගම් පනත යටතේද සංස්ථාපනය කළ සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් විදේශ සමාගමක් ලෙස හඳුන්වයි. මේවා අනේවාසික,නිර්නේවාසික එතෙර සමාගම් ලෙස ද හඳුන්වයි.

විදේශීය සමාගම් ලංකාවට වැදගත් වීමට හේතු

ෆවිදේශීය ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.

ෆ විදේශීය දියුණු තාක්ෂනය මෙරටට ලබා ගැනීමට හැකිවීම.

ෆ රැකියා අවස්ථා උත්පාදනය වීම.

ෆ සේවා සැපයීමෙන් විදේශ විනිමය උපයා ගැනීමට හැකි වීම.

ෆ ලියාපදිංචි ගාස්තු වශයෙන් විදේශ විනිමය උපයා ගැනීමට හැකි වීම.

## සමුපකාර

පුද්ගලයින් සමූහයක් විසින් මුදල් යොදවමින් තම ආර්ථික ශක්තිය වැඩි දියුණු කර ගැනීම උදෙසා ස්වෙච්චාවෙන් ඇතිකරගන්නා වූ සංවිධාන විශේෂයක් සමුපකාර ලෙස හඳුන්වා දිය හැක.

පෞද්ගලික අංශයට අයත් ව්‍යාපාර වර්ගයක් වන සමුපකාර ව්‍යාපාරය පෞද්ගලික අංශයේ සෙසු ව්‍යාපාර සංවිධාන වල දක්නට නොමැති සුවිශේෂී ලක්ෂණ ගණනාවකින් සමන්විත වේ. එසේම සමුපකාර ව්‍යාපාරය ද සමාගම් හි දක්නට ලැබෙන සීමාසහිත වගකීම, අසීමිත ජීව කාලය හා සාමාජිකයින් විසින් තෝරා පත් කරගන්නා අධ්‍යක්ෂක මණ්ඩලයක් විසින් පාලනය වීම යන ලක්ෂණ වලින් යුක්ත වූ නීතිමය ඒකකයකි.

සමුපකාරය සම්බන්ධයෙන් නෛතික නිර්වචනයක් නොමැත. ජාත්‍යන්තර සමුපකාර සංවිධානය 'සමුපකාරය' පහත සඳහන් පරිදි හඳුන්වා දී ඇත

”සිය සමාජයීය, ආර්ථික හා සංස්කෘතික අභිමතාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා ස්වේච්ඡාවෙන් ඒකරාශී වූ පුද්ගලයන්ගේ ඒකාබද්ධ සංවිධානයක් මෙන්ම ප්‍රජාතන්ත්‍රවාදී ලෙස පාලනය වන ව්‍යවසායක් සමුපකාරයක් වේ”

## සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය හා විකාශනය

සමුපකාර ව්‍යාපාරය ආරම්භ වූයේ එංගලන්තයේ ය. 1844 දී එංගලන්තයේ මැන්චෙස්ටර් ප්‍රදේශයෙහි රොච්ඩේල් ගම්මානයෙ කර්මාන්ත ශාලාවක වැඩ කළ කම්කරුවන් 28 දෙනෙකු පවුම බැගින් පවුම් 28 ක සාමාජික මුදල් යොදවා ආරම්භ කරන ලද ”රොච්ඩේල් සාධාරණ පුරෝගාමිකයන් ගේ සමිතිය” නූතන සමුපකාර ව්‍යාපාරයේ ආරම්භයයි. 1912 දී 'වැල්ලබඩ පත්තු ණය දෙන සමුපකාර සමිතිය' ආරම්භ වීම මෙරට සමුපකාර ව්‍යාපාරයේ ආරම්භය ලෙස සැලකේ.

සමුපකාර ප්‍රතිපත්ති එවකට රටේ පැවති සමාජ ආර්ථික පසුබිම සමග හොඳින් ගැලපීමත් රජයේ ආධාර සහ අනුග්‍රහය නොඅඩුව ලැබීමත් නිසා සමුපකාර ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ වේගයෙන් ව්‍යාප්ත වන්නට විය.

## සමුපකාර ව්‍යාපාරයේ සුවිශේෂී ලක්ෂණ

ලාභය මූලික අරමුණ නොවීම

සෑම සාමාජිකයෙකුටම එක් ඡන්දයක් බැගින් පමණක් හිමි වීම

ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සහිත ව්‍යාපාරයක් වීම

ස්වෙච්ඡාවෙන් එක් වූ පුද්ගල සංවිධානයක් වීම

පොදු අපේක්ෂා හා අවශ්‍යතා වලින් යුක්ත වීම

කොටස්වල අගය නොවෙනස්ව පැවතීම

සාමාජිකයන්ට සාමූහික අයිතියක් ඇත

ස්වාධීන සංවිධානයක් වීම

සහභාගිත්වය මත අතිරික්ත බෙදීම

සමුපකාර සාරධර්ම හා වටිනාකම්

සාරධර්ම

අවංක බව

විවෘත බව

සාමාජික වගකීම

අන්‍යයන් කෙරෙහි සැලකිලිමත් වීම

වටිනාකම්

ස්වයං උපකාරය

ස්වයං වගකීම

ප්‍රජාතන්ත්‍රවාදී බව

සමානාත්මතාව

## සමුපකාර ව්‍යාපාරයේ ප්‍රතිපත්ති

සමුපකාර ව්‍යාපාරයේ අරමුණු සහ පරමාර්ථ ලඟාකර ගැනීම සඳහා මග පෙන්වන දර්ශනයන් සමුපකාර ප්‍රතිපත්ති වේ. 1844 දී රොච්ඩේල් පුරෝගාමීන් තීරණය කරන ලද මෙම ප්‍රතිපත්ති 1995 මැන්චෙස්ටර් සමුළුවේදී සංශෝධනය කරන ලදී

විවෘත හා ස්වේච්ඡාමය සාමාජිකත්වය

සමුපකාර සමිති ස්වේච්ඡා සංවිධාන හෙයින් ස්ත්‍රී, පුරුෂ , වාර්ගික, දේශපාලන හෝ ආගමික භේදයකින් තොරව සමුපකාර සමිතියක සාමාජිකත්වය ලබාගත හැකිය

ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

කොපමණ කොටස් මිලදී ගත්තද සාමාජිකයෙකුට හිමි වන්නේ එක් ඡන්දයක් පමණි. මෙලෙස සාමාජිකයන්ගේ ඡන්දයෙන් තේරී පත්වූ පත් වූ නියෝජිතයන් මගින් මෙය පාලනය වේ.

සාමාජික, ආර්ථික සහයෝගීතාවය

සමුපකාර සමිතියක කොටස් ප්‍රාග්ධනය ට පොලියක් ගෙවන්නේ නම් එය සීමිත ප්‍රමාණයක් විය යුතුය. අතිරික්ත ප්‍රමාණ සාමාජිකයන්ගේ යහපතට යෙදවීම හෝ ඔවුන් අතර බෙදා හැරීම සිදු කළ යුතුය.

ස්වෛරීභාවය සහ නිදහස

සමුපකාර සමිති ඒවායේ සාමාජිකයන්ගෙන් පාලනය වන ස්වෛරී සංවිධාන වේ. සමුපකාර සමිති වලට රජය හෝ වෙනත් සංවිධාන වෙනත් සංවිධානවල සහය, ආශිර්වාදය තිබුණද සමිති පාලනයට ඒවාට අයිතියක් නොමැත.

සමුපකාර අධ්‍යාපනය, පුහුණුව සහ තොරතුරු ලබා දීම

සමුපකාර සංවිධානවල සංවර්ධනය සඳහා ඵලදායීව දායක විය හැකි පරිදි එහි සාමාජිකයින්ට, තේරී පත්වූ පත්වූ නියෝජිතයන්ට, කළමනාකරුවන්ට සහ සේවකයන්ට අධ්‍යාපනය හා පුහුණුව සැපයිය යුතුය.

සමුපකාර සමිති අතර සහයෝගීතාව

ප්‍රාදේශීය, ජාතික සහ ජාත්‍යන්තර වශයෙන් සමුපකාර  සමිති සහයෝගීව කටයුතු කිරීම මගින් ශක්තිමත්ව සහ ඉතාමත් ඵලදායී ලෙස සාමාජිකයින්ට සේවය සැලසිය යුතුය.

සමාජය පිළිබඳව සැලකිලිමත් වීම

සමුපකාර සමිති ස්වකීය අවශ්‍යතා සහ අපේක්ෂාවන් කෙරෙහි අවධානය යොමු කරන අතරම සමාජයේ තිරසාර සංවර්ධනය උදෙසා ද කටයුතු සිදු සිදුකළ යුතුය.

## සමුපකාර සමිතියක ලක්ෂණ

අයිතිය

සමුපකාර සමිතියක අයිතිය සාමාජිකයින් සතුය. අවම සාමාජික සංඛ්‍යාව 10 ක් වන අතර උපරිමය  සීමා රහිත ය.

ප්‍රාග්ධනය

සාමාජිකයන්ට කොටස් විකිණීමෙන් ප්‍රාග්ධනය සපයා ගනී. කොටසක වටිනාකම රුපියල් සියයකි . එය රුපියල් 10ක මූලික ගෙවීමකින් ආරම්භ කර වර්ෂයක් තුළ දී සම්පූර්ණ කළ යුතු ය. මීට අමතරව රජයෙන් සහ බැංකුවලින් අරමුදල් සම්පාදනය කෙරේ.

වගකීම

සමුපකාර සමිතියක වගකීම සීමිත වේ. සාමාජිකයින් කැමැත්ත මත වගකීම අසීමිතව පවත්වා පවත්වා ගන්නා අවස්ථා ද දැකිය හැකිය උදාහරණ ලෙස සීමා රහිත ණය දෙන සමිති දැක්විය හැක.

ලියාපදිංචිය

ලියාපදිංචිය අනිවාර්ය වේ . සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ලියාපදිංචිය සිදු කරයි . වර්තමානයේ අදාළ පළාත් සභාවේ සමුපකාර සංවර්ධන කොමසාරිස් යටතේ ලියාපදිංචිය සිදු වේ.

පරිපාලනය

සමුපකාර සමිතියක් සාමාජිකයින් අතරින් පත්කරගන්නා මණ්ඩලයක් මගින් පාලනය කරයි.  කුඩා සමිතියක කාරක සභාවක් ද විශාල සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලයක් ද දැකිය හැකිය. අධ්‍යක්ෂ මණ්ඩලය අවමය හතකි .

නීතිමය පුද්ගලභාවය

නීතිමය පුද්ගල භාවයක් ඇති අතර නෛතික කටයුතු වලදී සමිතියෙ නමින් පෙනී සිටිය හැක.

පැවැත්ම

සමුපකාර සමිතියක ට එහි සාමාජිකයන් ගෙන් වෙන් වූ ස්ථිර අඛණ්ඩ පැවැත්මක් ඇත

ගිණුම් තැබීම හා විගණනය

ගිණුම් තැබීම හා විගණනය අනිවාර්‍ය වේ . සමුපකාර සංවර්ධන කොමසාරිස් ගේ අධීක්ෂණයට යටත්ව විගණනය සිදු කෙරේ.

ලාභාලාභ භුක්ති විඳීම

සමුපකාර සමිතියක ලාභයක් වේ නම් එය '''අනුග්‍රාහකත්ව දීමනාවක්' ලෙස සාමාජිකයන් අතර බෙදා හරී. එසේම සමිතියේ හෝ සාමාජික අභිවෘද්ධිය උදෙසා ද ලාභයේ කොටසක් යෙදවිය හැකිය.

බදු ගෙවීම

සමුපකාර සමිතියේ ලාභය මත සමිතියෙ නමින් බදු ගෙවිය යුතුය.

## සමුපකාර සමිති ලියාපදිංචි කිරීම

ශ්‍රී ලංකාවේ සමුපකාර සමිති ලියාපදිංචි කරනු ලබන්නේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපකාර සංවර්ධන කොමසාරිස්වරයා විසිනි. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව පළාත් සභා යටතේ විමධ්‍යගත කර ඇති බැවින් ඒ ඒ පළාත් සභාවල සමුපකාර සංවර්ධන කොමසාරිස්වරු යටතේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබයි.

සමුපකාර සමිතියක් ලියාපදිංචියට ඉදිරිපත් කළයුතු ලියවිලි

1. ලියාපදිංචිය සඳහා වූ අයදුම්පත්‍රය

2. යෝජිත අතුරු ව්‍යවස්ථාවේ පිටපත් දෙකක්

3. සමිතිය පිහිටුවීමේ ආර්ථික යෝග්‍යතාවය දැක්වෙන ප්‍රකාශයක්

4. සමිතිය ලියාපදිංචි කළ යුතු බවට යෝජනා කළ රැස්වීම් වාර්තා වාර්තාවේ පිටපතක්

5. සාමාජිකයින් සාමාජික ගාස්තු ගෙවූ බවටත් එම මුදල් කාරක සභාව යටතේ පවතින බවට සහතිකයක් (ගිණුම් වාර්තාවක් )

6.සමිතියේ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය සහ ඊට ළඟා වන ගමන් මාර්ගය දැක්වෙන සිතියමක්

7.කාරක සභිකයින්ගේ නම් ලැයිස්තුවක් සහ ඔවුන්ගේ වත්කම, බැරකම් පිළිබඳ විස්තරයක්

## අතුරු ව්‍යවස්ථාව

සමුපකාර සමිතියක අභ්‍යන්තර පාලනයට අදාළ කොන්දේසි ඇතුළත් ලියවිල්ල අතුරු ව්‍යවස්ථාව වේ එහි පහත කරුණු ඇතුළත් වේ.

සමුපකාරයේ නම සහ ලිපිනය

පරමාර්ථ

සමුපකාරයේ සතු බලතල

සාමාජිකත්වය පිළිබඳව

කොටස් මුදල් පිළිබඳව

සමිතියේ වගකීම

අධ්‍යක්ෂක මණ්ඩලය හා කාරක සභාව පිළිබඳව

රැස්වීම් හා ගණපූර්ණය( රැස්වීමක සිටිය යුතු අවම සාමාජිකයින් සංඛ්‍යාව )

සභාපති ලේකම් සහ භාණ්ඩාගාරික පිළිබඳව

මුදල් පාලනය පොත්පත් හා ලේඛණ පිළිබඳව

ගිණුම් තැබීම හා විගණනය පිළිබඳව

අතිරික්තය බෙදාහැරීම

මුද්‍රාව භාවිතය සම්බන්ධව

## සමුපකාර සමිතියක අතිරික්තය බෙදාහැරීම

සමුපකාර සමිතියක අතිරික්තය සමිතියේ අතුරු ව්‍යවස්ථාවට අනුකූලව බෙදාහරිනු ලැබේ .එය පහත සඳහන් ආකාර වලින් එක් ආකාරයකට හෝ ආකාර කිහිපයකට සිදුවිය හැක.

1. සමුපකාර සමිති සංවර්ධනය සඳහා සඳහා ප්‍රති ආයෝජනය කිරීම
2. සාමාජිකයින් අනුමත කළ වෙනත් කටයුතු වලට පරිත්‍යාග කිරීම
3. සාමාජිකයින් වෙත බෙදා හැරීම

සමුපකාර සමිතියක ලාභ බෙදීමේ පදනම අනුග්‍රාහක ප්‍රතිගෙවීම ලෙස හැඳින්වේ. සමිතියෙ සාමාජිකයන් සමිතිය සමඟ කරන ලද ගනුදෙනු වල වටිනාකම පදනම් කරගෙන ලාභ බෙදීම මෙම ක්‍රමයේ විශේෂත්වයයි. මෙලෙස අනුග්‍රාහක ප්‍රතිගෙවීම මත ලාභ බෙදීම මගින් සාමාජික උනන්දුව වැඩි කිරීම, සාමාජිකයා හා සමිතිය අතර සම්බන්ධතා ශක්තිමත් කිරීම, සාමාජිකයා තුළින් සමිතිය දියුණු කර ගැනීම වැනි අරමුණු ඉටු කර ගත හැකිය.

## සමුපකාර සමිතියක් විසුරුවා හැරීම

සමුපකාර සමිතියක් විසුරුවා හැරීම පිළිබඳව තීරණ ගනු ලබන්නේ සමුපකාර සංවර්ධන කොමසාරිස් වරයා විසිනි. සමුපකාර සමිතියක සියලු වත්කම් විකුණා එම මුදලින් සියලු වගකීම් පියවා දැමීමෙන් පසු සමුපකාර සමිතිය විසුරුවා හැරීම සිදු කළ හැකිය.

සමුපකාර සමිතියක් විසුරුවා හැරීමට බලපාන කරුණු

1. සමිතියේ සාමාජිකයන් ගෙන් 3/4ට වඩා වැඩි පිරිසකගේ ඉල්ලීම මත.

2. ලියාපදිංචියෙන් පසු වර්ෂයක් ඉක්මවන තෙක් ව්‍යාපාරික කටයුතු ආරම්භ නොකිරීම.

3. අවම සාමාජික සංඛ්‍යාව නොසිටීම.

4. වර්ෂ දෙකක කාලයක සිටසමුපකාර සමිතිය අක්‍රියව පැවතීම.

5. සමිතිය විසුරුවාහැරීම සාධාරණයැයි සමුපකාර සංවර්ධන කොමසාරිස් වරයා තීරණය කිරීම.

## සමුපකාර ව්‍යාපාරයේ ව්‍යුහය

මෙරට සමුපකාර ව්‍යාපාරය ප්‍රධාන මට්ටම් තුනකින් සමන්විත වී ඇත.

ප්‍රාදේශීය සමුපකාර සමිති (ප්‍රාථමික මට්ටම)

යම් බල ප්‍රදේශයක් තුළ පවත්වාගෙන යනු ලබන එම ප්‍රදේශයේ පුද්ගලයන්ගේ සාමාජිකත්වයෙන් සමන්විත සමිති වේ.

දිස්ත්‍රික් සමුපකාර සමිති ( ද්විතීක මට්ටම )

ප්‍රාදේශීය මට්ටමේ සමුපකාර සමිති එකතු වී දිස්ත්‍රික් හෝ පළාත් මට්ටමෙන් පිහිටුවා ගන්නා සමුපකාර සමිති මෙයට අයත් වේ.

මුදුන් මට්ටමේ සමුපකාර සමිති (ජාතික මට්ටම)

ද්විතීයික මට්ටමේ සංගම් නියෝජනය වන පරිදි එක් එක් ක්ෂේත්‍රයේ සඳහා දිවයිනටම එක බැගින් පිහිටුවාගත් මව් සංගම් වේ. උදාහරණ ලෙස සණස මහා සංගමය, සී/ස ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය දැක්විය හැක.

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරයේ දියුණුව උදෙසා කටයුතු කරන ආයතන

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

මෙරට සමුපකාර ව්‍යාපාරය නියාමනය කිරීම සඳහා පිහිටුවා ඇති රාජ්‍ය ආයතනය වන්නේ සමුපකාර සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව යි.

කාර්යභාරය:

සමුපකාර සමිති ලියාපදිංචි කිරීම

සමුපකාර ප්‍රතිපත්ති රට පුරා ව්‍යාප්ත කිරීම

සමුපකාර සමිතිවල ගිණුම් විගණනය කිරීම

සමුපකාර සමිති පිළිබඳ මහජන පැමිණිලි පරීක්ෂා කිරීම

සමුපකාර සමිති වල තත්ත්වය උසස් කිරීමට කටයුතු කිරීම

සමුපකාර සමිති පාලනය කිරීම

ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය

ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය මෙරට සමුපකාර ව්‍යාපාරයේ මුදුන් මට්ටම නියෝජනය කරන ආයතනයයි.

කාර්යභාරය:

සමුපකාර ප්‍රතිපත්ති ආරක්ෂා කිරීම

සමුපකාර සම්බන්ධව රජයට සම්බන්ධව රජයට උපදෙස් ලබා දීම

ජාත්‍යන්තර සමුපකාර සංවිධානය හරහා ජාත්‍යන්තර සම්මේලන සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම

සමුපකාරය පිලිබද දේශනා දේශන සහ සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කිරීම

සමුපකාර පිළිබඳ ප්‍රකාශන නිකුත් කිරීම සහ පුස්තකාල පහසුකම් සැලසීම

සමුපකාර පිළිබඳ ගැටලු වලදී සමුපකාර සමිති හා රජය අතර අතරමැදියකු ලෙස කටයුතු කිරීම

සමුපකාර නියෝජිතයන් සමග පැවැත්වෙන වාර්ෂික රැස්වීම්වලදී සමුපකාර පරමාර්ථ හා ප්‍රතිපත්ති තීරණය කිරීම

සමුපකාර සමිති වල කළමණාකරණය පිළිබඳ උපදෙස් ලබා දීම

## සමුපකාර සේවක කොමිෂන් සභාව

සමුපකාර සමිති වල සේවය කරන සේවකයින් ගේ පත්වීම්, මාරුවීම්, විනයානුකූල කටයුතු පිළිබඳ ව පවතින විවිධාකාර ගැටළු සලකා බලා ඒවා විසඳීමට කටයුතු කරනු ලබන ආයතනයයි.

කාර්යභාරය:

සමුපකාර සමිති වල විවිධ තනතුරු වලට අදාලව සේවකයන් බඳවා ගැනීම සම්බන්ධ ක්‍රියාපටිපාටි තීරණය කිරීම

විවිධ තනතුරු වලට අදාල සේවක පත් කිරීම අනුමත කිරීම

සේවක අභියාචනා විභාග කොට සහන සැලසීම

සමුපකාර සේවකයින්ගේ අවම වැටුප් තීරණය කිරීම

සමිති සේවකයන්ට විරුද්ධව විනයානුකූල තීරණ ගැනීමේදී එය ගත යුතු ආකාරය සම්බන්ධයෙන් උපදෙස් ලබා දීම

සමුපකාර ව්‍යාපාරයේ වාසි

උපරිම සාමාජික සංඛ්‍යාව සීමාවක් නොවන නිසා විශාල ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම

ස්ථිර අඛණ්ඩ පැවැත්මක් තිබීම

සමාජ වගකීමක් දැරීම

මහා පරිමාණ ව්‍යාපාර වලට පිවිසිය හැකි වීම

වගකීම සීමිතව පවත්වාගත හැකිවීම

එක් සාමාජිකයෙකුට එක් ඡන්දයක් පමණක් හිමි වන නිසා සමානාත්මතාව රැකීම

නෛතික පුද්ගල භාවයක් පැවතීම

ආරම්භ කිරීම සාපේක්ෂව පහසු වීම

සමුපකාර ව්‍යාපාරයේ අවාසි

මූල්‍ය සම්පාදන මාර්ග සීමිත වීම

සමුපකාර ප්‍රතිපත්ති මත ම කටයුතු කිරීමට සිදු වීම

කොටස් අයිතිය පහසුවෙන් පැවරීමට නොහැකි වීම

එක් එක් සාමාජිකයාට හිමි වන  පුද්ගලික ප්‍රතිලාභ ප්‍රමාණය අඩුවීම

පුද්ගලික ප්‍රතිලාභ අඩු වන නිසාම සාමාජික උනන්දුවද අඩුවීම

කළමනාකරණය කාර්යක්ෂම නොවීම

සාමාජිකයින් මිලදී ගන්නා කොටස් සඳහා සීමිත පොලියක් හිමිවන බැවින් අපේක්ෂා කරන තරම් විශාල ප්‍රාග්ධනයක් රැස් කර ගත නොහැකි වීම

සමුපකාර සිල්ලර වෙළඳසැල් ක්‍රමයේ අකාර්යක්ෂමතාවයට බලපෑ හේතු

විද්‍යුත් මුදල් භාවිතයට පහසුකම් නොමැති වීම

ස්වයං සේවා ක්‍රම ක්‍රියාත්මක නොවීම

සේවකයින්ගේ අකාර්යක්ෂම සේවා

දක්ෂ සේවකයින් ගේ හිගය හා පහළ මට්ටමේ වැටුප් ගෙවීම

දුර්වල ප්‍රවර්ධනය

සමුපකාර සමිති පාලනයට දේශපාලන බලපෑම් එල්ල වීම

පාරිභෝගිකයින් කේන්ද්‍ර කරගෙන කටයුතු නොකිරීම නිසා ගනුදෙනුකරුවන් ආකර්ෂණය නොවීම

සාමාජිකයින්ට ලැබෙන ප්‍රතිලාභ අඩු නිසා සාමාජික ලැදියාවන් අඩුවීම

## වරලත් ව්‍යාපාර

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය කරන ආයතනයක් නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් තුළ තම ව්‍යාපාරය කරගෙන යාම සඳහා වෙනත් ව්‍යාපාරයකට බලය පැවරීමේ ක්‍රමය වරලත් ව්‍යාපාර ලෙස හැඳින්වෙයි. නැතහොත් කිසියම් වෙළඳ නාමයක් හෝ වෙළඳ ලකුණක් හෝ සංකේත භාවිත කරමින් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා වරලත් හිමියකු සහ වරලත් ලාභියකු අතර ඇතිකරගන්නා ව්‍යාපාරික සම්බන්ධතාව වරලත් ව්‍යාපාරයක් ලෙස හැඳින්වෙයි.

වරලත් ව්‍යාපාරයකට සම්බන්ධ පාර්ශවයන්

වරලත් හිමියන් (වරලත් සමාගම/ මව් ආයතනය/ විකුණන්නා) ත්‍රබජයසිැර

භාණ්ඩ හා සේවා නිෂ්පාදනය සම්බන්ධයෙන් සුවිශේෂී කීර්තිනාමයක් සහිත ආයතනයකි. තම නිෂ්පාදන නිෂ්පාදනය කිරීමට හෝ අලෙවි කිරීමට අවසර දෙන්නේ වරලත් හිමියා ය.

උදා: ඡස˚˚ ඨමඑ( පීසා හට්), එජ äදබ්කි( මැක්ඩොනල්ඩ්ස් ), ණාපසඃ ණැබඑමජනහ ත්‍රසැා කයසපජනැබ*

වරලත් ලාභියා (මිලදී ගනු ලබන්නා/ වරලත් කරු /යැපෙන ආයතනය) ත්‍රබජයසිැ

වරලත් සමාගමක වෙළඳ නාමය හෝ වෙළඳ ලකුණ හෝ සංකේතය යටතේ භාණ්ඩ විකිණීමට ගිවිසුමකින් අවසර ලබා ගන්නා ආයතනය වරලත් ලාභියා ලෙස හැඳින්වෙයි.

උදා:

මව් ආයතනය  යැපෙන ආයතනය

Mc Donalds    ABANS Restaurant System ( Pvt) Ltd

Pizza Hut    KEELS Restaurant (Pvt) Ltd

KFC    CARGILLS Ceylon Limited

දේශීය වරලත් ව්‍යාපාර සඳහා උදාහරණ ලෙස ඩයලොග් වරලත් අලෙවිසැල්, ඛනිජ තෙල් බෙදාහැරීමේ අලෙවිසැල්, රාජ්‍ය ඔසුසල  වරලත් අලෙවිසැල් සඳහන් කළ හැක.

වරලත් ව්‍යාපාර වර්ග

ක්‍රියාත්මක වන ආකාරය අනුව වරලත් ව්‍යාපාර කොටස් තුනකට වර්ග කළ හැක.

නිෂ්පාදිතය සඳහා වූ වරලත් ව්‍යාපාර

මෙහිදී වරලත් සමාගමේ නිශ්පාදිත වරලත් ලාභියාට වරලත් සමාගමේ නමින් නැවත විකිණීමට අවසර ලැබේ.

උදා: ෂධක වැනි ඉන්ධන පිරවුම් හල්

නිෂ්පාදනය සඳහා වූ වරලත් ව්‍යාපාරය

වරලත් හිමියාගේ වෙළඳ ලකුණ යටතේ භාණ්ඩ නිෂ්පාදනය කර බෙදා හැරීමට වරලත් ලාභියාට අයිතිය පැවරෙන වරලත් ව්‍යාපාර ක්‍රමයයි.

උදා: Cocacol`

## ව්‍යාපාර ක්‍රමය සඳහා වූ වරලත් ව්‍යාපාර

වරලත් සමාගමේ නමින් සහ ක්‍රමය යටතේ ව්‍යාපාර පවත්වා ගැනීමට වරලත් ලාභියාට බලය පැවරෙන ක්‍රමයකි.

උදා: එප ඈදබ්කිල ණාකල ජස'ී යමළු

වරලත් ව්‍යාපාර ක්‍රමයේ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ

වරලත් සමාගම සහ වරලත් ලාභියා එකඟ වූ ගිවිසුමක් යටතේ ව්‍යාපාරය පවත්වා ගැනීම

අවශ්‍ය ප්‍රාග්ධනය වරලත් ලාභියා විසින් යෙදවීම

අවශ්‍ය උපදෙස් පහසුකම් වරලත් සමාගම මගින් ලබාදීම

වරලත් සමාගමේ වෙළඳ නාමය භාවිතා කරමින් වරලත් ලාභියා ව්‍යාපාරය පවත්වාගෙන යාම

ලැබෙන ලාභයෙන් වරලත් සමාගම වෙත පුරස්කාරයක් හෝ කොමිස් මුදලක් ගෙවිය යුතු වීම

මෙම ක්‍රමය යටතේ වරලත් ලාභියා වෙත "පිළියෙල කළ ව්‍යාපාරයක්" රඨාහ - ජ්ාෑ ඉම්සබ්ෑ හිම්වේ

වරලත් සමාගම හා වරලත් ලාභියා අතර ඇතිවන ගිවිසුමක අන්තර්ගත කොන්දේසි

වරලත් ලාභියාට ඉටු කිරීමට අවසර ලැබෙන කාර්යයන්

වරලත් ලාභියාට ආවරණය කළ හැකි භූගෝලීය ප්‍රදේශය

වරලත් ගිවිසුම වලංගු වන කාලය

වරලත් සමාගම මගින් සැපයෙන සේවාවන්

වරලත් ලාභියා විසින් සපුරාලිය යුතු අවශ්‍යතා

ගෙවිය යුතු පුරස්කාරය හෝ කොමිස් මුදල

ගිවිසුම බිඳ වැටීමට තුඩු දෙන හේතු

වරලත් සමාගම විසින් වරලත් ලාභියාට ලබාදෙන සේවාවන්

තම වෙළෙඳ නාමය යෙදීමට අවසර දීම

නිෂ්පාදන අන්තර්ගතය හා නිෂ්පාදන උපදෙස් සැපයීම

සේවකයන් පුහුණු කර දීම

කළමනාකරණ උපදෙස් සැපයීම

තාක්ෂණික සහාය ලබාදීම

ව්‍යාපාර ස්ථානගත කිරීමට උපදෙස් දීම

ණය පහසුකම් සැපයීම

වරලත් ව්‍යාපාර ක්‍රමය සාර්ථකව පවත්වා ගැනීම සඳහා වරලත් ලාභියා ඉටු කළ යුතු වගකීම්

අවශ්‍ය ප්‍රාග්ධනය ආයෝජනය කිරීම

වරලත් සමාගමේ නිෂ්පාදිත පමණක් අලෙවි කිරීම

ගනුදෙනු පිළිබඳව නිවැරදි වාර්තා තබා ගැනීම හා ඒවා නිවැරදිව වරලත් සමාගමට ඉදිරිපත් කිරීම

වරලත් සමාගම නියම කරන මිලටම අලෙවි කිරීම

වරලත් සමාගමේ කීර්තිනාමය ආරක්ෂා වන පරිදි ක්‍රියා කිරීම

වරලත් ගිවිසුමක් බිඳ වැටීමට තුඩු දෙන හේතු

වරලත් ගිවිසුමෙන් අවසරය ලබා දී නොමැති භාණ්ඩ නිපදවීම හෝ සැපයීම

පුරස්කාර හෝ කොමිස් මුදල් නියමිත පරිදි නොගෙවීම

ගිවිසගත් කාලය තුළ ව්‍යාපාරය ආරම්භ නොකිරීම

වරලත් ලාභියා වරලත් සමාගමේ කීර්තිනාමයට හානි වන ලෙස කටයුතු සිදුකිරීම

ගනුදෙනු පිළිබඳ නිවැරදි වාර්තා වරලත් සමාගම වෙත ඉදිරිපත් නොකිරීම

වරලත් ව්‍යාපාර ක්‍රමයේ වාසි

වරලත් සමාගමට,

මූලික ආයෝජනයකින් තොරව ව්‍යාපාර පුළුල් කළ හැකි වීම

ප්‍රචාරණ වියදම් වරලත් ලාභියා සමඟ බෙදාගත හැකි වීම

වරලත් ලාභියාගේ ආයෝජනයෙන් ප්‍රතිලාභ ලැබිය හැකි වීම

දේශීය හා විදේශීය වශයෙන් ව්‍යාපාර ව්‍යාප්ත කිරීම පහසු වීම

ගනුදෙනුකරුවන් වැඩි වී තම කීර්ති කීර්ති නාමය වැඩි වීම

තම කොන්දේසි වලට අනුව වරලත් ලාභියා ව පාලනය කල හැකි වීම

වරලත් ලාභියාට ,

කෙටි කාලයක් තුළදී විකුණුම් වැඩිවී ලාභය වැඩි කර ගත හැකි වීම

කළමනාකරණ පුහුණුව ලැබීම

අසාර්ථක වීමේ ප්‍රවණතාවය අඩු වීම

වරලත් හිමියාගෙන් මූල්‍ය පහසුකම් ලැබීම

අමු ද්‍රව්‍ය අඩු මිලට ලබා ගත හැකි වීම

පහසුවෙන් වෙළඳපල අත්පත් කර ගත හැකි වීම

පාරිභෝගිකයාට,

ඉහළ මට්ටමේ පාරිභෝගික සත්කාරයන් අත්විඳිය හැකි වීම

ලෝකයේ විවිධ රටවල දී එකම වට්ටෝරුවක භාණ්ඩ පරිභෝජනය කිරීමට අවස්ථාව ලැබීම

ගුණාත්වයෙන් උසස් භාණ්ඩ, විවිධ වර්ග වල භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම

නිශ්චිත මිල ගණන් යටතේ භාණ්ඩ පරිභෝජනයට අවස්ථාව ලැබීම

වරලත් ව්‍යාපාර ක්‍රමයේ අවාසි

වරලත් සමාගමට,

තම වෙළෙඳ රහස් පිටතට යාම

සාර්ථක වරලත් ලාභීන් සීමාසහිත වීම

දිගුකාලීනව වරලත් ලාභියා ගිවිසුමෙන් ඉවත් ව ස්වාධීනව ව්‍යාපාරය ආරම්භ කිරීමේ අවදානමක් තිබීම

වරලත් ලාභියා සිදු කරනු ලබන වැරදි නිසා තම කීර්ති නාමයට හානි සිදුවීම

වරලත් ලාභියා සිදුකරන සෑම කටයුත්තක්ම සමීපව අධීක්ෂණය කිරීම අපහසු වීම

වරලත් ලාභියාට,

වරලත් ලාභියාට තමන්ට අනන්‍ය වූ ව්‍යාපාර නාමයක් ලබා ගත නොහැකි වීම

විශාල මුදලක් පුරස්කාරය ලෙස ගෙවීමට සිදු වීම

වරලත් හිමියා සමඟ ඇතිකරගන්නා ගිවිසුමේ කොන්දේසි බොහෝවිට වරලත් ලාභියාට අවාසිදායක වීම

පැවැත්ම වරලත් හිමියා මතම රඳා පැවතීම

වරලත් සමාගමේ භාණ්ඩ පමණක් අලෙවි කිරීමට සිදු වීම

වරලත් සමාගම නියම කරන විවිධ කොන්දේසි පිළිපැදීමට සිදු වීම

වරලත් සමාගම නියම කරන මිලට ම භාණ්ඩ අලෙවි කිරීමට සිදු වීම

## රාජ්‍ය අංශයේ ව්‍යාපාර

රජය පළාත් සභා හෝ පළාත් පාලන ආයතන වලට අයිතිය හිමි වන ජනතාවට ප්‍රතිලාභ ලබාදීම සඳහා පවත්වාගෙන යන ව්‍යාපාර වේ. පොදු ව්‍යාපාර මහජනයා සතු ව්‍යාපාර ලෙස ද හඳුන්වයි. වෙළෙඳපොළ මගින් සැපයිය හැකි භාණ්ඩ හා සේවා නිෂ්පාදනය හා/හෝ බෙදාහැරීම පිළිබඳව කටයුතු කරන රජයේ ආයතන හා සංස්ථා රාජ්‍ය ව්‍යවසායන් ලෙස හැඳින්වේ .

ව්‍යාපාර කටයුතු රජය යටතේ පවත්වාගෙන යාමට හේතු

ලාභදායී නොවන අත්‍යවශ්‍ය මහජන සේවා සැපයීම

පෞද්ගලික අංශයේ කටයුතු පාලනය කිරීම

පෞද්ගලික ඒකාධිකාරීත්වය වැලැක්වීම

ජාතික ආරක්ෂාව සඳහා

ආර්ථිකයේ වැදගත් කර්මාන්ත අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා

සම්පත් නාස්තිය වැළැක්වීම සඳහා

සේවා නියුක්ති අවස්ථා වර්ධනය කිරීම සඳහා

රජයට ආදායම් ඉපයීම සඳහා

පොදු හිමිකාරීත්වයේ වාසි

මහජනතාව වෙනුවෙන් ආර්ථිකයේ විශාල වැඩ කොටසක් රජයට පහසුවෙන් සැලසුම් කළ හැකි වීම

ව්‍යාපාර ලාභ ලැබීම සහ එම ලාභය නැවත ජනතාවගේ ම යහපත උදෙසා යෙදවිය හැකි වීම

ව්‍යාපාර නවීකරණය කිරීමට අවශ්‍ය අරමුදල් රජයට පහසුවෙන් සපයා ගත හැකි වීම

සමාජ  සේවාවන් සැපයිය හැකි වීම

දේශීය සම්පත් උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීමට හැකි වීම

පොදු හිමිකාරීත්වයේ අවාසි

වංචා දූෂණ ඉතා ඉහල වීම

තරගකාරීත්වය අඩුවීම

අනවශ්‍ය ලෙස සේවකයන් වැඩිපුර යොදා ගැනීම

නාස්තිය සිදුවීමට ඇති ඉඩකඩ වැඩිවීම

රජයේ අනම්‍ය නීතිරීති ව්‍යාපාර වල පැවැත්මට හිතකර නොවීම

අහිතකර ලෙස දේශපාලන බලපෑම් ඇතිවීම

සේවා වල ගුණාත්වය අඩුවීම

## පොදු ව්‍යවසාය පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව/ කෝප්

Committee On Public Enterprises / COPE

රාජ්‍ය ව්‍යවසායන්හි කටයුතු විමර්ශනය කිරීම සඳහා පත් කර ඇති පාර්ලිමේන්තු කමිටුව මින් අදහස් කෙරේ. රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාව ලෙස හඳුන්වන මෙය රාජ්‍ය සංස්ථා, මණ්ඩල අධිකාරි, රාජ්‍ය සමාගම්, රාජ්‍ය බැංකු හා රජයට පවරාගත් ව්‍යාපාරවල ගිණුම් කටයුතු විමර්ශනය සිදු කරයි. ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් ද මෙම කමිටුව සමන්විත වේ.

## රාජ්‍ය ගිණුම් කාරක සභාව

Committee of Public Accounts / COPA

පාර්ලිමේන්තුව තේරීම් කමිටු මගින් තෝරා පත් කරගනු ලබන මන්ත්‍රීවරු දහ නව දෙනකුගෙන් සමන්විත පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවයි. මෙය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල ගිණුම් ප්‍රධාන වශයෙන් විමර්ශනය කරයි.

රාජ්‍ය දෙපාර්තමේන්තු

පූර්ණ රාජ්‍ය  හිමිකාරීත්වය, අමාත්‍යාංශගත  පාලනය යටතේ ලාභ ලැබීමේ මුඛ්‍ය පරමාර්ථයෙන් තොරව රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව ව්‍යාපාර කටයුතු පවත්වා ගන්නා ආයතනයකි.

උදා: දුම්රිය දෙපාර්තමේන්තුව, තැපැල් දෙපාර්තමේන්තුව

දෙපාර්තමේන්තුව වල දැකිය හැකි ලක්ෂණ

අයිතිය

පූර්ණ වශයෙන් රජය සතු වේ.

පිහිටුවීම

රාජ්‍ය දෙපාර්තමේන්තුව පිහිටුවීමට අදාළ කැබිනට් මණ්ඩල යෝජනාවක් සම්මත කිරීමෙන් දෙපාර්තමේන්තුවක්  පිහිටුවනු ලබයි

ප්‍රාග්ධනය

රජය සපයයි. එනම් වාර්ෂික අයවැය මගින් වෙන් කෙරේ

පාලනය

රජයේ සෘජු පාලනයට යටත් වේ. මෙහිදී,

- පාර්ලිමේන්තු පාලනය

මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න කිරීම හරහා ගිණුම් කාරක සභාවෙන් සිදුවන පාලනයයි.

- අමාත්‍යංශ පාලනය

අමාත්‍යාංශ ප්‍රධානීන්ගේ හා අමාත්‍යවරයාගේ සෘජු පාලනයයි

වගකීම

දෙපාර්තමේන්තුවක වගකීම අසීමිතය . රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරය එම වගකීම දරයි.

ආදායම් හා ලාභ

ලාභ අරමුණක් නොමැත. එහෙත් ආදායම් හා ලාභ ඇත්නම් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කෙරේ.

නෛතික පුද්ගලභාවය

රාජ්‍ය දෙපාර්තමේන්තුවකට නෛතික පුද්ගල භාවයක් නැත. නීතිමය කටයුතුවලදී ආයතන ප්‍රධානියාගේ නිල නමින් පෙනී සිටිය යුතුය.

ගිණුම් තැබීම හා විගණනය

අනිවාර්ය වේ. විගණකාධිපති දෙපාර්තමේන්තුව මගින් විගණනය සිදු කෙරේ.

කළමනාකරණය

පාර්ලිමේන්තු ප්‍රධානියකු මගින් පරිහරණය සිදු කරන අතර ඒ සඳහා ,

ආයතන සංග්‍රහය - ආයතන පරිපාලනය ට

මුදල් රෙගුලාසි - මුදල් පරිපාලනයට

චක්‍රලේඛ හා වෙනත් නීති නීතිරීති අදාළ කර ගනී.

බදු බැඳියාව

බදු බැඳියාවක් නොමැත.

පැවැත්ම

පාර්ලිමේන්තුවෙන් ඒ ඒ වර්ෂයන්ට අදාල මුදල් වැය කරන තෙක් ක්‍රියාත්මක වේ. එනම් දිගු කාලීන පැවැත්මක් ඇත.

ඈවර කිරීම

රජයේ අභිමතය අනුව පාර්ලිමේන්තු යෝජනා සම්මතයකින් පසුව ඈවර කිරීම සිදු කරයි.

ව්‍යාපාර කටයුතු සඳහා දෙපාර්තමේන්තු සුදුසු නොවීමට හේතු

මහා භාණ්ඩාගාරයේ අරමුදල් මත පමණක් යැපෙන නිසා ප්‍රසාරණය සඳහා අරමුදල් සීමා වීම

රජයේ අනම්‍ය නීති පිළිපැදිය යුතු වීම නිසා ස්වාධීන ක්ෂණික තීරණ ගත නොහැකි වීම

සේවක පෙළඹවීම සඳහා ප්‍රමාණවත් දිරිගැන්වීම් සැපයිය නොහැකි වීම

නිලධාරීන් විසින් පාලනය කරන නිසා දැඩි නිලධාරී වාදයක් පැවතීම

වාණිජ මුහුණුවරක් නොමැතිවීම

රාජ්‍ය සංස්ථා, දෙපාර්තමේන්තු විවිධ ස්වරූපයෙන් සීමාසහිත සමාගම් ලෙස පෞද්ගලීකරණය කිරීම වර්තමානයේ දක්නට ලැබෙන ප්‍රවණතාවයකි. උදාහරණ ලෙස ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම, ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් සමාගම, ලංකා පිගන් සමාගම දැක්විය හැක. මෙම පෞද්ගලීකරණ වැඩපිලිවෙලවල් විවිධ නම්වලින් හැඳින්විය හැක.

වාණිජකරණය‍ Commercialization

වාණිජකරණය යනු කළමනාකරණය පමණක් පෞද්ගලික අංශයට පැවරීමයි. පැලවත්ත සීනි සමාගම, රජයේ වතු ආදිය මුල් කාලයේදී මෙම ක්‍රමය යටතේ පෞද්ගලීකරණය කළේය. වර්තමානයේ දී මෙම ක්‍රමය ටරම් භාවිතයට ගනු නොලැබේ.

ජනතාකරණය - Peopalization

ජනතාකරණය ලෙස හඳුන්වන්නේ රජයේ සංස්ථා හෝ රජයට අයත් ව්‍යාපාර, පොදු සමාගම් බවට පරිවර්තනය කිරීම මගින් ඒවායේ ප්‍රාග්ධනයට පෞද්ගලික අංශය, ජනතාව හා සේවකයින් සහභාගී කර ගැනීමයි. උදාහරණයක් ලෙස මධ්‍යම ගමනාගමන මණ්ඩලය දැක්විය හැක.

පෞද්ගලීකරණය - ඡරසඨ්එස’එසදබ

රාජ්‍ය අංශයට අයත් ව්‍යාපාරවල පූර්ණ අයිතිය පෞද්ගලික අංශය සතු කිරීම මින් අදහස් කෙරේ. උදාහරණයක් ලෙස ජාතික රක්ෂණ සංස්ථාව දැක්විය හැක.

පසුගිය කාලය තුළ දෙපාර්තමේන්තු රාමුවෙන් ඉවතට ගත් ව්‍යාපාර,

ගුවන්විදුලි දෙපාර්තමේන්තුව  ගුවන් විදුලි සංස්ථාව

විදුලිබල දෙපාර්තමේන්තුව  ලංකා විදුලිබල මණ්ඩලය

ගුවන් සේවා දෙපාර්තමේන්තුව  සිවිල් ගුවන් සේවා අධිකාරිය

## රාජ්‍ය සංස්ථා

සමාගම් පනත යටතේ හැර වෙනත් කිසියම් ලිඛිත නීතියක් හෝ නියමයක් යටතේ සංස්ථාපනය කළා වූ හෝ කරන්නා වූ ද රජය විසින් ප්‍රාග්ධනය ලෙස, ණයක් ලෙස හෝ ආධාරයක් ලෙස මුළු අරමුදල ම හෝ ඉන් කොටසක් සපයන්නා වූ ද සංස්ථාවක්, මණ්ඩලයක්, ආයතනයක් රාජ්‍ය සංස්ථාවක් වේ.

රාජ්‍ය සංස්ථා පහත දැක්වෙන නම්වලින් ද හඳුන්වනු ලැබේ

රාජ්‍ය නීතිගත සංස්ථාව, සමායතනය, සංයුක්ත මණ්ඩලය, කොමිස අධිකාරිය, කොමිෂන් සභාව, මණ්ඩලය, කාර්යාංශය

රාජ්‍ය සංස්ථාවක දැකිය හැකි ලක්ෂණ

අයිතිය

රාජ්‍ය සංස්ථාවල අනිවාර්ය රාජ්‍ය හිමිකාරීත්වයක් ඇත. ඒ 100% ක් හෝ අවම වශයෙන් 51%ක් විය හැකිය

පිහිටුවීම

රාජ්‍ය සංස්ථාවක් පොදු හෝ විශේෂ පාර්ලිමේන්තු පනතක් යටතේ පාර්ලිමේන්තුවේ සංස්ථාපනය කොට පිහිටුවනු ලබයි. මෙහිදී පොදු පනතක් යනු කිසියම් ක්ෂේත්‍රයකට අදාල පොදුවේ සම්මත කරන ලද පනතකි

උදා: 1973 රාජ්‍ය කෘෂිකාර්මික සංස්ථා පනත

- ජනතා වතු සංවර්ධන මණ්ඩලය

- ශ්‍රී ලංකා කපු සංස්ථාව

විශේෂ පනතක් යනු එක් එක් සංස්ථාව වෙනුවෙන් වෙනමම සම්මත කරන ලද පනතකි.

උදා: 1961 අංක 29 දරන මහජන බැංකු පනත - මහජන බැංකුව

ප්‍රාග්ධනය යෙදවීම

මුළුමනින්ම හෝ වැඩි ප්‍රමාණයක් රජය හා රාජ්‍ය නියෝජිත ආයතන සපයයි. පෞද්ගලික අංශය සම්බන්ධ වන විටකදී කොටස් හා ණයකර නිකුත් කොට ප්‍රාග්ධනය සපයා ගනී.

වගකීම

වගකීම අසීමිතය. එහෙත් කොටස් නිකුත් කර ඇත්නම් එම කොටස් කොටස්කරුවන්ගේ කොටස් කරුවන් ගේ වගකීම සීමිතය.

පාලනය

රාජ්‍ය සංස්ථාවක පාලනය විවිධාකාර වේ.

අභ්‍යන්තර පාලනය

- අධ්‍යක්ෂක මණ්ඩලයක් විසින් සිදු කරයි

බාහිර පාලනය

- ව්‍යවස්ථාපිත පාලනය (සංස්ථාව පිහිටවූ පනතේ නියමයන් අනුව)
- අමාත්‍යාංශ පාලනය (විෂය භාර ඇමතිවරයා මගින්)
- පාර්ලිමේන්තු පාලනය (පාර්ලිමේන්තු ගිණුම් කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව)
- විගණකාධිපතිගේ පාලනය (ගිණුම් විගණනය මගින්)

ලාභාලාභ බුක්ති විඳීම

රාජ්‍ය සංස්ථාවක ලාභය රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කළ හැක. පෞද්ගලික කොටස් හිමියන් වේ නම් ඔවුන්ට ලාභාංශ වශයෙන් බෙදා දිය හැකි ය. එසේම සංස්ථාවේ දියුණුවට ප්‍රති ආයෝජනය කළ හැකිය.

නෛතික පුද්ගලභාවය

නෛතික පුද්ගල භාවයක් ඇත. රාජ්‍ය සංස්ථාවක නාමය නීති නීතිය ඉදිරියේ පුද්ගලයෙක් වශයෙන් පිළිගැනේ.

ගිණුම් තැබීම හා විගණනය

අනිවාර්ය වේ. අදාළ පනතේ විධිවිධාන වලට අනුකූලව කළ යුතුය . සංස්ථා වල ගිණුම් විගණකාධිපතිගේ අධීක්ෂණයට යටත් වේ.

බදු ගෙවීම

සංස්ථාව නමින් බදු ගෙවිය යුතුය

පැවැත්ම

අඛණ්ඩ පැවැත්මක් ඇත

විසුරුවා හැරීම

සංස්ථාවේ කටයුතු අවසන් කළ යුතු බව අදාළ ඇමතිවරයා අදහස් කරනු ලබන අවස්ථාවක පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයකින් පසුව විසුරුවා හැරේ.

රාජ්‍ය සංස්ථා ක්‍රියාත්මක වන ක්ෂේත්‍ර

නිෂ්පාදන ක්ෂේත්‍රය (කාර්මික නිෂ්පාදනය , කෘෂි නිෂ්පාදනය )

වෙළඳ ක්ෂේත්‍රය (බෙදාහැරීමේ කටයුතු වල නිරත සංස්ථා )

සේවා ක්ෂේත්‍රය (ප්‍රවාහනය, වරාය, ගුවන් විදුලිය )

මූල්‍ය ක්ෂේත්‍රය (රක්ෂණ කටයුතු , බැංකු කටයුතු- මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව)

රාජ්‍ය සංස්ථා අකාර්යක්ෂම වීමට හේතු

ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ දැනුමක් නොමැති අය අධ්‍යක්ෂකවරුන් ලෙස පත් කිරීම නිසා කළමනාකරණය අකාර්යක්ෂම වීම

ඔරොත්තු නොදෙන තරම් සේවක අතිරික්තයක් පැවතීම නිසා සේවක පිරිවැය වැඩිවීම

දේශපාලන ඇඟිලි ගැසීම් පැවතීම

වංචා සහ දූෂණ මෙන්ම සම්පත් නාස්තියද අධිකවීම

ප්‍රමාණවත් තරම් අරමුදල් නොමැතිවීම

වානිජමය මුහුනුවරක් නොමැතිවීම

ඇතැම් රාජ්‍ය සංස්ථාවල කාර්ය කාර්යභාරය ප්‍රමාණය ඉක්මවා පුළුල් වීම

සේව්‍ය-සේවක පක්ෂ අතර ආරවුල් ඇතිවීම

රාජ්‍ය සංස්ථා කාර්යක්ෂම කිරීමට රජය ගෙන ඇති විවිධ ක්‍රියාමාර්ග

පෞද්ගලික අංශයේ දක්ෂ ව්‍යාපාරිකයන්, වෘත්තීය ප්‍රවීණයන් රාජ්‍ය සංස්ථාවල ප්‍රධාන තනතුරට පත්කිරීම

ඇතැම් රාජ්‍ය සංස්ථාවල අයිතිය රජය යටතේ තබා ගෙන කළමණාකරනය පෞද්ගලික අංශය වෙත පැවරීම

ඉහළ වැටුප් යටතේ දක්ෂ කළමනාකරුවන් හා සේවකයන් බඳවා ගැනීම

ඇතැම් රාජ්‍ය සංස්ථා වාණිජ මුහුණුවරක් යටතේ තරගකාරී ලෙස නවීකරණය කිරීම

ඇතැම් රාජ්‍ය සංස්ථා ප්‍රතිව්‍යුහගත කිරීම

රාජ්‍ය දෙපාර්තමේන්තු වලට වඩා රාජ්‍ය සංස්ථාවක් යොමු වීමට හේතු

විවිධ මූල්‍ය මාර්ග පැවතීම හේතුවෙන් වැඩි ප්‍රාග්ධනයක් ඒකරාශී කර ගත හැකි වීම

මහා භාණ්ඩාගාරයේ දැඩි මූල්‍ය රෙගුලාසි වලින් නිදහස් වීම

ඉහළ වැටුප් යටතේ දක්ෂ කළමනාකරුවන් හා සේවකයන් බඳවා ගත හැකි වීම හා සේවක පෙළඹවීමේ ක්‍රම ක්‍රියාත්මක කළ හැකි වීම

අධ්‍යක්ෂක මණ්ඩලයක් තුළින් සාර්ථක කළමනාකරණයක් සිදු කළ හැකි වීම

වාණිජ මුහුණුවරක් යටතේ සංවිධානය කළ හැකිවීම

## රාජ්‍ය සමාගම්

මුළු කොටස් ප්‍රාග්ධනයෙන් 50% ට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය නියෝජිත ආයතන විසින් හා ඉතිරි ප්‍රමාණය පෞද්ගලික අංශය යටතේ වූ සමාගම් පනත අනුව සංස්ථාපනය කරනු ලබන ආයතනය විශේෂ රාජ්‍ය සමාගම් ලෙස හැඳින්වෙයි

උදා:

රජයේ පෞද්ගලික සමාගම් - සී/ස ලංකා විදුලි (පෞද්ගලික ) සමාගම

රජයේ පොදු සමාගම් - ස්වාධීන රූපවාහිනිය , සී/ස ලංකා හොස්පිටල් සමාගම

රාජ්‍ය සමාගම් වල ලක්ෂණ

සමාගම් පනත යටතේ සංස්ථාපනය කිරීම

කොටස් නිකුත් කොට ප්‍රාග්ධනය සපයා ගැනීම

කොටස් අයිතියෙන් 51%ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් රජය සතු වීම

වගකීම සීමිත වීම

අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් පරිපාලනය කිරීම

නෛතික පුද්ගල භාවයක් පැවතීම

ව්‍යාපාර පවත්වා ගැනීමේදී රාජ්‍ය සංස්ථා හා දෙපාර්තමේන්තු වලට වඩා රාජ්‍ය සමාගම් යෝග්‍ය වීමට හේතු

කොටස් හා ණයකර නිකුත් කිරීම තුළින් වැඩි ප්‍රාග්ධනයක් සපයා ගත හැකි වීම නිසා ප්‍රාග්ධන ගැටලු අවම වීම

මූල්‍ය ස්වාධීනත්වයක් පැවතීම

අධ්‍යක්ෂ මණ්ඩලයක් තුළින් සාර්ථක කළමනාකරණයක් කළ හැකි වීම

වාණිජ මුහුණුවරක් යටතේ තරගකාරී ලෙස පවත්වා පවත්වා ගත හැකි වීම

සමාගම් පනත යටතේ මනා බාහිර පාලනයකට යටත් වීම

## පළාත් සභා සහ පළාත් පාලන ආයතන සතු ව්‍යාපාර

පළාත් සභා, මහ නගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා වැනි පළාත් පාලන අධිකාරිය විසින් පවත්වාගෙන යන පවත්වා ගෙන යන ව්‍යාපාරයන් ද දක්නට ලැබේ. ඒ ඒ පළාත් පාලන අධිකාරිය සතු වන බැවින් පොදු අයිතිය හෙවත් ජනතා අයිතිය යටතට ඇතුළත් කළ හැකිය. මේවාට අවශ්‍ය අරමුදල් පළාත් පාලන ආයතනය විසින් හෝ මධ්‍යම රජයෙන් හෝ යොදනු ලබන අතර ඒවායේ පරිපාලන කටයුතු ඒ ඒ පළාත් පාලන අධිකාරීන් යටතේ ක්‍රියාත්මක වේ.

උදා:

වෙළඳ සංකීර්ණ කුලියට දීම, කාබනික පොහොර නිපදවීම නිපදවීමේ ව්‍යාපෘති, සති පොළ, ක්‍රීඩා පිටි, උත්සව හා රංග ශාලා

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

↓

www.ALNoteBook.com

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."